

සන්න සගීත

# ශබ්ධබිංදූව



සන්නසහිත

# ශබ්දබින්දුව

බටුවන්තුඩාවේ පඬිතුමන්ගෙන්

උපදේශලබාගෙණ


ගල්වාණේ විහාරවාසී

**මුල්ලේරියාවේ විපුලසාරසාමීන්**

විසින්


සන්න ලියා සකස්කරදෙනලදී


ඇම්. යූ. සුබසේරිස් ප්‍රේරා විසින්

ලඞ්කාභිනවවිශ්‍රැතයන්ත්‍රාලයෙහි

මුද්‍රණය කරවනලදී

ශ්‍රී බුද්ධවර්ෂ 2432

ක්‍රි. 1888

# SABDA BINDUWA

WITH A PARAPHRASE

EDITED BY

THE REVD M. VIPULASARA

OF

GALWANE VIHARE

REVISED BY

BATUWANTUDAWE PANDIT

Published By

M. U. SUBASERIS PERERA

Printed

AT THE LANKABHINAWAWISRUTA PRESS

by

N. M, PERERA, PRINTER

COLOMBO

1888

# ශබ්ද බින්දුව

මේපොත මීට හවුරුදු සියගණනකින් පෙර බුරුමරට භික්ෂු ධම්මරාජ ගුරුනම් මහාස්ථවිරකෙනෙකුන් විසින් මූල කච්චායන ආශ්‍රයෙන් ශබ්දශාස්ත්‍ර අල්පාභ්‍යාසයෙන් සිත තබාගන්නා පිණිස සාදනලද්දකි - මීට අරිමද්දන නුවර සහි කාරම්වංශී ඤාණවිලාසනම් ස්ථවිරකෙනෙකුන් විසින් සාදනලද "ලීනත්ථසූදනී" නම් ටීකාවකුදු තිබේ - එහි සද්දබින්දු යන්නෙහි අර්ථදක්වමින්

"සද්දබින්දූති" එත්ථ සද්දතීති සොතවිඤ්ඤාණං උපගච්ඡතීති සද්ද — විඤ්ඤාතුජසද්ද — සද්ගතීති - සද්දීයතී උච්චාරීයතීතිවා සද්ද — සබ්බඤ්ඤුනා කසද්ද - සද්දීයතී උච්චාරීයතී අත්ථා එතෙහීතිවා සද්ද - සද්දවිසයත්තියං වාචායං - අප්පච්චියො - බින්දූති සමන්තතො පරිවජ්ජතීති බින්දු - බින්දුපරිමණ්ඩලෙ — සද්දානං බින්දු සද්දබින්දු " කියත්

කච්චායනයෙහි - සන්ධි නාම කාරක සමාස තද්ධිත ආඛ්‍යාත කිතක උණාදියයි අටවැදෑරුම් ලවත් මෙහි කිතක උණාදිය එකක්කොට දක්වීමෙන් සත්වැදෑරුම්. මෙහි අනු සාසනධීන්ගේ ග්‍රහණිය තුන්වෙනි ගාථාවසානයෙහිද නාමයෙහි දක්වනලද බුධ පුම යනාදී ශබ්දයන් බොහෝ සේ කච්චායන රූප සිද්ධි ආදියට සහ ටීකාවටත් එකහකර ගණින් පිරෙණ පරිද්ද ඇතම් ශබ්දයෙක්හි විභක්ත්‍යනු රූප පදමාලාද තැවිරුඩ මහා සද්දනීති කාරක අග්ගවංශාචාරීන්ගේ මතයද අවසානයෙහි යෙදුවෙමි - කාරක සමාස තද්ධිත ආඛ්‍යාත කිතක යනමේ පංචප්‍රකාරය සම්බන්ධව ටීකා ඉතාවිස්තරනමුත් ග්‍රන්ථබාහුල්‍යභීතියෙන් මදකොට දක්වීමි.

"යෙසං න සන්තාපයකද, නොභාසත්ථ තතවෙරිතා
සම්මොහබන්ධනභතා වෙනෙනාවබුජ්ඣ නත්ති කිඤ්චිපි"

යු බැවින් ශබ්දශාස්ත්‍රයාගේ ගණින් මිනුම් ආදිය ලුහුඬින් සිත තබාගන්නා කැමති ශබ්දශාස්ත්‍රාභියොගීන්ට මෙය ප්‍රයොජනවත්වේයි.

මුල්ලේරියාවේ ගුණරතන සාමීන්වහන්සේගෙන් පළමු වෙන් ශාස්ත්‍රාදග්‍රහණ කොට යළිත් විද්‍යෝදය පිරිවෙණාධිපති හික්කඩුවේ ශ්‍රී සුමඞ්ගලාභිධාන නායකස්ථවිර පාදයන් වහන්සේවෙත ශාස්ත්‍රාදග්‍රහණ කරණ මුල්ලේරියාවේ ගල්වාණේ විහාරවාසී මුල්ලේරියාවේ විපුලසාරනමැති මා විසින් සලෝකයා ප්‍රයෝජන සලකා සන්නකොට සකස් කර මුද්‍රණය කරවනු කැමතිව පොත් කිපයක් සහ ටීකා කිපයකුත් සපයාගෙණ බලනකල තේරුම්ගත නොහැකි බොහෝතැන් දකින්ට ලැබුනහෙයින් දෙන් අප්‍රසිද්ධ සීල්මා බවුවන්තුඩාවේ පණ්ඩිතුමාකරා එලඹ අස්වා තේරුම් කරවාගෙණ යලින් එම පණ්ඩිතුමන්ගෙන් ලබනලද සංස්කෘතශබ්ද ශාස්ත්‍රයෙහි ආවාවූ විචිත්‍ර ගුරුකම්ද මෙහි අනන්‍යභිතකාරණලදී එසේම සන්නකොට මුද්‍රණය කරවිමෙහිදී අවසාන සිඛිපත්‍රයක් දක්වා සකස් කරණලදී.

"සතවිතවා හිඤ්දතවා පෘථගාජනස්
නානාසත්‍රකිංසතන් මම කොවිදෙජනඃ
ප්‍රමානාමිශ්‍රීංදයතෙව යඃ පරාන්
ප්‍රම්ව ජනාති සඃතො තළේදෘශී"

M. WIPULASĀRA.

සන්නස සහිත

# ශබ්දබින්දුව

නමො තස්ස භගවතො අරහතො
සම්මාසම්බුද්ධස්ස

1 යස්ස ඤෙය්‍යෙසු ධම්මෙසු නානුමත්තං පවෙදිතං
නත්වා සද්ධම්මසඞ්ඛ්‍යං තං සද්දබින්දුං සමාරභෙ

යස්ස, යමෙකුන් නොහොත් යම් සම්මාසම්බුද්ධ කෙනෙකුන් විසින්; ඤෙය්‍යෙසු ධම්මෙසු, දතයුතු දහම් අතුරෙන්; අනුමත්තංඅපි, මඳමාත්‍රාවකුත්; නඅවෙදිතං, අවබොධ නොකරණ ලද්දේ නොවේද [මුළුල්ල අවබොධ කරණ ලදැයි සේයි] සද්ධම්මසඞ්ඛ්‍යං, නවලොකොත්තර ධර්‍මයහා අෂ්ටාර්‍ය්‍ය පුද්ගල සඞ්ඛ්‍යාසහිතවූ; තං, ඒසර්‍වඥයන්වහන්සේ; නත්වා වැඳ, සද්දබින්දුං, ශබ්දබින්දුනම් ප්‍රකරණයක්; සමාරභෙ, පටන්ගණිමි.

2 කාදීරිතා නවසඞ්ඛ්‍යා කමෙන ටාදි යාදි ච
පාදයො පඤ්ච සඞ්ඛ්‍යාතා සුඤ්ඤනාමා සරාඤනා

කාදී, කකාරාදීය; ටාදී, ටකාරාදීය; යාදිච, යකාරාදීහුදු යි යනමේ ගණත්‍රය; කමෙන, ක්‍රමයෙන්; නවසඞ්ඛ්‍යාඊරිතා, නවසඞ්ඛ්‍යායයි කියනලද්දූහ [එකාදී නවය අවසන් සඞ්ඛ්‍යාහ යි සේයි;] පාදයො, පආදීහු; පඤ්චසඞ්ඛ්‍යාතා, පඤ්චසඞ්ඛ්‍යායයි කියනලද්දූහ [පවර්‍ගය එකාදී පසයි] සරාඤනා, [කසයින් සයින්, අ, ආ, ඉ, ඊ, උ, ඌ, එ, ඔ, යනඅටයි මුගලන් නයින්, එ ඒ ඔ ඕ, යි සතරක් වතහෙයින් දසයක්වේ] ස්වරාක්ෂරය ච වර්‍ගාන්ත ත වර්‍ගාන්ත ඤකාර නකාරදෙදෙනය යනමොහු; සුඤ්ඤනාමා, ශූන්‍යාක්ෂරනම්වෙත්.

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 0 |
|---|---|---|---|---|---|---|---|---|---|
| ක | ඛ | ග | ඝ | ඞ | ච | ඡ | ජ | ඣ | ඤ |
| ට | ඨ | ඩ | ඪ | ණ | ත | ථ | ද | ධ | න |
| ප | ඵ | බ | භ | ම | — | — | — | — | — |
| ය | ර | ල | ව | — | — | ස | හ | ළ | – |

[යකාරාදියෙහි පස්වෙනි සවෙනි දෙතැන්හි තාලව්‍ය මූර්ධන්‍ය ශකාර ෂකාර දෙදෙනා බැහැ, ස, හ, ළ, යනවර්ණයන් සත්වෙනි අටවෙනි නවවැන්නන්කෙරෙති, ය, ර, ල, ව, ස, හ, ළ, කියා කවරහෙයින් දන්ත්‍යජ මූර්ධජ ලකාර ළකාර දෙක ගන්නාලද්දයත්? පුරාතනයන් විසින් කළ ගණින්පුරණ පිණිසයි]

3 **සරෙ ලොපො සරා පුබ්බා ලුත්තා වාපි පරෙ රමා**
**බ්‍යඤ්ජනාවාගමා වාපි දීඝරස්සාදි සම්භවා**

සරෙති එව, ස්වරපරනිමිත්තම; ලුත්තා, ලොප්කරණලද; පුබ්බසරා, පූර්වස්වරයො; වාපි, සුසැටෙකි; පරෙ, [ස්වරයා කෙරෙන් ලොප්කරණලද] පරස්වරයො; රමා, දෙපණ සකි; බ්‍යඤ්ජනාආගමාච, බ්‍යඤ්ජනආගමයෝද; වාපි, සුසැටකි; දීඝරස්සාදි, දීර්ඝහ්‍රස්වාදීහු; සම්භවා, සූත්‍රානුරූපයෙන් සම්භවවෙත් නොවත් ලැබුනපරිද්දෙන් දතයුතුයි * ඒ මෙසේයි—

---

* ආදිශබ්දයෙන්, අව්වනත්‍රං=තඑරිව=යනාදිආදෙශ සන්ධිද
ජයිමානි-පවුච්චති-යනාදි ආගමසන්ධිද
තිණිමානි-යස්සදානි-යනාදිලොප සන්ධිද
අභොඅවපරියං=ගමිනිරෙ ඔදකහායිකෙ යනාදී ප්‍රකෘති සන්ධිද
නාස්සවොරාපසහනති—නණ්හාස්සවිපහීණා යනාදි සංයොග සන්ධිද
පුප්ඵංසා-එවංසතෙ යනාදි විසංයොග සන්ධිද
ඔකමොකතො-උබ්භතො ඔකමොකතඋබ්භතො යනාදී ජනුස්පිණිසවු සන්ධිද ගණිත්.

එහෙයින් සන්ධිකල්පයෙහි කිවමනාතාක් සන්ධිප්‍රයොග ඇතුළත්කෙරෙත්.

අකාරයාපරකල්හි, ලෝකග්ගො-ලෝක අග්ගො; සොතුකාමත්ථාවුසො-සොතුකාමා අත්ථ ආවුසො; නත්ථඤ්ඤං-නත්ථි අඤ්ඤං; ඉච්චගමා=ඉති අගමා; තශ්වා-තු අශ්වා; ජඹඟී=ජඹු අඟී; ධනම්මත්ථි=ධනමෙව අත්ථි; මුසාවාදස්ස හොති=මුසාවාදේ අස්ස හොති.

ආකාරයාපරකල්හි, සද්ධායතනං=සද්ධා ආයතනං; අවිජ්ජාසවො-අවිජ්ජා ආසවො; අයං වුච්චතානන්ද-අයං වුච්චති ආනන්ද; ඉච්චාකාරෙන-ඉති ආකාරෙන; සමෙතායස්මා-සමෙතු ආයස්මා; අභිභායතනං-අභිභු ආයතනං; මාසි හදයනිස්සිතං-මෙ ආසි හදයනිස්සිතං; එසාවුසො-එසො ආවුසො.

ඉකාරයාපරකල්හි, පඤ්චින්ද්‍රියානි-පඤ්ච ඉන්ද්‍රියානි; පඤ්ඤින්ද්‍රියං-පඤ්ඤා ඉන්ද්‍රියං; සතින්ද්‍රියං-සති ඉන්ද්‍රියං; ඉත්ථින්ද්‍රියං-ඉත්ථි ඉන්ද්‍රියං; ධාතින්ද්‍රියානි-ධාතු ඉන්ද්‍රියානි; ජම්බිස්සරෙ-ජම්බු ඉස්සරෙ; සබ්බිස්සරා-සබ්බෙ ඉස්සරා; චතස්සිත්ථියො-චතස්සො ඉත්ථියො.

ඊකාරයාපරකල්හි, දසීරිතා=දස ඊරිතා; සබ්බීතියො-සබ්බා ඊතියො; අධීරිතං-අධි ඊරිතං; භික්ඛුනීරිතං-භික්ඛුනී ඊරිතං; ධාතීරිතා-ධාතු ඊරිතා; ජම්බීරිතා-ජම්බු ඊරිතා; වචනම්මීරිතං වචනංමෙ ඊරිතං; චතස්සීතියො-චතස්සො, ඊතියො.

උකාරයාපරකල්හි, පචුඩං-පච උඩං; තථූපමං=තථා උපමං; ඉසූත්තමො-ඉසි උත්තමො; නදූදකං-නදී උදකං; මාතූපට්ඨානං-මාතු උපට්ඨානං; වධූත්තමා-වධූ උත්තමා; ගාථා මුදීරිතා-ගාථාමෙ උදීරිතා; සතොපලබ්භති—සතෙතා උපලබ්භති.

ඌකාරයාපරකල්හි, එකෙනූනානි-එකෙන ඌනානි; නාගනාසූරු-නාගනාස ඌරු; උදධූම්මියො-උදධි ඌම්මියො; රාජිනූරු-රාජිනී ඌරු; සීතූරු-සීතු ඌරු; සරභූම්මිවෙගො-සරභූ ඌම්මිවෙගො; සොභනාමූරු-සොභනාමෙ ඌරු; චතස්සූම්මියො-චතස්සා ඌම්මියො.

එකාරයාපරකල්හි, යස්සෙතෙ චතුරො ධම්මා-යස්ස එතෙ චතුරො ධම්මා; යථෙව-යථා එව; නගෙවං-නඟි එවං; සාධු

ගෙසා-සාමිනී ඒසා; ආගෙඝගෙතසං පභාවයිං-අගෙතු එතං පභාවයිං; වගෙධසා-වධූ එසා; සුතාගම්මිතං-සුතා ගෙම එතං; කුගෙනඑ ලබනා · කුගෙනා එනඑ ලබනා.

ඕකාරයාපරකල්හි, තගෙජාගධා · තජජ ඕගධා, අවිගජ්ජා ගඝා-අවිජ්ජා ඕඝො; දීඝොඝො දීඝ ඕඝො; භීනබුතොවා ගදු-භීනබුධි ඔවාදෙ; විජ්ජොභාසො-විජ්ජා ඔභාසො; ජම්බොනතා-ජම්බු ඔනතා; ලතෝමොකාසෝ-ලතොමෝ ඔකාසො; වසභොරොහා වසභා ඔරොහා.

අකාරාදී සඃරපරනිමිත්තෙන් ලොප්කරණලද පූර්වසඃර සිවුස, ටිමෙම්දේයි

---

අකාරයාකෙරෙන් ලොප්කරණලද සඃරසත

පපචලද්දපානච - ප අපචලද්දපානච; යස්සඳනි-යස්ස ඉඳනි; තවතියො-තව ඊතියො; මමුසොගෙහා-මම උසොගෙහා; තවරුයා-තව ඌරුයා; එකකො-එක එකො; ඔමකාවකො ඔමකා ඔමකො.

ආකාරයාකෙරෙන්සත, ජායාව ජායා ඉව; සාබාරිතා-සාබා ඊරිතා; භානුමාදෙති-භානුමා උදෙති; පභානතා-පභා ඌනතා; එසාව-එසා එව; පඤ්ඤින්ද්‍රියභාසො-පඤ්ඤින්ද්‍රිය ඔභාසො;

ඉකාරයාකෙරෙන්සත, ඉතිපි-ඉති අපි; ඊපො-ඊ අපො මුනීරිසා-මුනි ඊරිසා; මුනිසභො-මුනි උසභො; භූමිසා-භූමි ඌසා, වුඩ්ඩිවසස-වුඩ්ඩි එවඅයං; මුනිවදතිඅඛානානං-මුනි ඔවදතිඅනානං.

ඊකාරයාකෙරෙන් සය, අභාසමණීසි-අභාසමණී අසි; ඉසී ස්සුං-ඉසී ආසුං; නදිදකං නදී උදකං; පඨවීසො-පඨවී ඌසො; දීඝදස්සීව-දීඝදස්සී එව; නදීරපාරං-නදී ඔරපාරං.

උකාරයාකෙරෙන්සය, හෙතුපි-හෙතු අපි; විනොතාතුහා රජං-විනොතාතු අහාරජං; චක්ඛුන්ද්‍රියං-චක්ඛු ඉන්ද්‍රියං; මඤ්ඤවායුරිතා-මඤ්ඤ වායු ඊරිතා; උජුව-උජු එව; නිබ්බාතුභිතභාරොඝං නිබ්බාතු ඔහිතභාරොඝං;

ඌකාරයාකෙරෙන්සය, අකතඤ්ඤූසි-අකතඤ්ඤූ අසි; වදඤ්ඤූසි-වදඤ්ඤූ අසි; ජම්බුව-ජම්බු ඉව; සමඤ්ඤූ

රිතා සම්බුද්ධ ඊරිතා; සබ්බඤ්ඤුතඤ්ඤෙව-සබ්බඤ්ඤුතං එව ජම්බූනතා-ජම්බු ඔනතා.

ඒකාරයාකෙරෙන් සත. වමෙ'ඳහං-වමෙ ඳ අහං; තෙවීරණ්ණං-තෙ ආවීරණ්ණං; කෙවෙ-කෙ ඉමෙ; එතරිතා-එතෙ ඊරිතා; තෙපසම්මන්ති-තෙ උපසම්මන්ති; නෙපසම්මන්ති-නෙ උපසම්මන්ති; මෙක්ඛිකාසො-මෙ ඉක්ඛිකාසො.

ඔකාරයාකෙරෙන් සත, සොහං-සො අහං; මොග්ගල්ලානොසි මොග්ගල්ලානො අසි; චත්තාරොමෙ-චත්තාරො ඉමෙ; තෙජොරණ්ණං-තෙජො ඊරණ්ණං; අධොරත්ථං අධො උරත්ථං; අධොරුපබ්බං-අධො ඌරුපබ්බං; පාතොව-පාතො එව

අකාරාදි ස්වරයන්කෙරෙන් ලොප්කරණලද
පරස්වර දෙපණිය මෙසේයි

---

අකාරාදි ස්වරයන්ගෙන් පරකල්හි යකාරාගම, පරියනත්තං-පරි අනත්තං; පරියාදානං පරි ආදානං; නයිමස්ස විජ්ජා-න ඉමස්ස විජ්ජා; දසයිරිතා-දස ඊරිතා; පරියුට්ඨානං-පරි උට්ඨානං; වියූහති-වි ඌහති; පරියෙසති-පරි එසති, පරියොදාතෙ-පරි ඔදාතෙ.

වකාරාගම, තිවඞ්ගං-ති අඞ්ගං; භුවාදයො-භූ ආදයො; දුවින්ද්‍රියං-දු ඉන්ද්‍රියං; දුවීතිකං-දු ඊතිකං; ආසනාවුට්ඨාය-ආසනා උට්ඨාය; සවූනුදරො-ස ඌනුදරො; දුවෙසනා-දු එසනා; සබ්බවොසිතවොසානං-සබ්බවොසිත ඔසානං.

මකාරාගම, සමණාමචලො-සමණ අචලො; ඉධමාහු-ඉධ ආහු; භද්‍රකසාමිව-භද්‍රකසා ඉව; අසුභදසමීරිතා-අසුභදස ඊරිතා; ඝිනමුක්කණ්ඨෙසු-ඝින උක්කණ්ඨෙසු; ජලධිමූමියො-ජලධි ඌමියො; නමෙසො මාරිස-න එසො මාරිස; ඔකමොකතො-ඔක ඔකතො;

දකාරාගම, අත්තදත්ථං-අත්ත අත්ථං; උදහටං-උ අහටං; යාවදිච්ඡිතං-යාව ඉච්ඡිතං; උදීරිතං-උ ඊරිතං; තදුහනො-ත ඌහනො; යදූනකං-ය ඌනකං; සම්මදෙව සම්මා එව; සම්මදඤ්ඤාවිමුත්තා-සම්මා අඤ්ඤාවිමුත්තා

මකාරාගම, ගුණමිචානගිජ්ජතීයො ගුණවා අභිජ්ජති යො; චිරමායති-චිරං අයති; රජමිඛි-රජ ඉඛි; බධමිරණ-බධ ඊරණ; අභිනවාභුද්ධා-අභිනව උද්ධා; තමෙනාතුනතා-තමො උනතා; චිරමෙනාච-චිරං එච; ඕඝ මෙනාතරිතා ඕඝං ඔතරිතා

දකාරාගම, අජ්ජදග්ගෙ-අජ්ජ අග්ගෙ; අජ්ජදාරබ්භ-අජ්ජ ආරබ්භ; තදමිනා-තං ඉන; තදමිනාතිරිතං තදමිං ඊරි යං; අජ්ජදුපාදිතං-අජ්ජ උපාදිතං; දගසනාතූමියො-දගස නා ඌමියො; තදමිනෙව-තදමිං එව; නමොගධං- න ඔගධං.

රකාරාගම, පාතුරහොසි පාතු අහොසි; දුරාජීවො-දු ආජීවො; සාසපොරිව ආරග්ගෙ-සාසපො ඉව ආරග්ගෙ; නිරීඞ්ගණෝ-නි ඊඞ්ගණෝ; දුරුත්තං-දු උත්තං; නිරූසං කණ්ඩා-නි ඌසං කණ්ඩා; සබ්භිරෙව-සබ්භි එව; චතුරොඝ-චතු ඔඝ.

ලකාරාගම, ඡළභිඤ්ඤා ඡ අභිඤ්ඤා; ඡළායතනං-ඡ ආයතනං; ඡළින්ද්‍රියානි-ඡ ඉන්ද්‍රියානි; ඡළීතියො ඡ ඊතියො; ඡළුද්දෙසා-ඡ උද්දෙසා; ඡළූමියො-ඡ ඌමියො; ඡළෙතෙ-ඡ එතෙ; ඡළොකාසතිමෙනො *

අකාරාදි ස්වරයන් අටදෙනා අතුරෙන් එකක් එකක් පරකල්හි යකාරාදිවූ සුඅට ව්‍යඤ්ජනාගමප්‍රයොගයෝ මෙසේයි

---

මෙයේ ප්‍රයෝග දක්වාදුන්කිසි මනුමාගෙ ත්‍රාදාහරණයක් දක්වනෙනා.

4 කොකාසෙනාගතොසිස සොනිඹිමචදසසයි

අරාජවග්ගිමෙසිතා සොතූතමෙම්සදිස්සියො. 'සි සිංත්.

කො, කවරෙක්; ආකාසෙන, අහසින්; ආගතො, ආයේද; ඉසි, ඍෂියෙක්; සො, හෙතෙම; කෙන, කුමක්කරණකොට,

---

* ගකාරාගම වනාහි, පුථ, පා, ශබ්දයන්කෙරෙන් එකාර ඔකාර පරකල්හිමවේ. එහෙයින් ඒ ප්‍රයෝගයෝ මෙහි නොදක්වන ලද්දාහුය

ගෙණ; ඉසිං, සෘෂිය; අභිඅදස්සයි, අභිදක්කොට දුටුවේද— අජ. එළිවෝය, ආබු. මීයෝය, අග්ගි, ගිනිය, මා, චන්ද්‍රයාය, ඉසීනං. සෘෂිහූය යනමොවුන්ගේ; අථ, සතුරෙනම්-සා, සුනකයා; ඔතු බලල්ය; සං, ජලය; මෙඝ, මේඝය; ඉත්ථියො, ස්ත්‍රීහූය යන මොහුයි පිළිවෙළින් සබඩ කටයුතුයි කො, ආකාසෙසි. ආගතො, ඛුසි, සො,* සෙන, ඉසිං; අභි අදස්සයි අථ. අජ, ආබු, අග්ගි, මා, ඉසීනං, සා, ඔතු. සං, මෙඝ, ඉත්ථියො, යි පදවෙන්දකොට පූර්වව්‍යඤ්ජනයා ස්වරයෙන් වෙන්කොට "සරාසරෙලොපං, වාපරොඅසරූපා, ලොපඤ්චතත්‍රාකාරො, සබ්බොචන්ති, පරද්වෙභාවොඨානෙ, මදාසරෙ, දීඝං, වමොදුදන්තානං, රස්සං, ක්වචාසවණ්ණංලුත්තෙ, වග්ගන්තංවාවග්ගෙ, යවමදනතරලාචාගමා, සරාපකතිබ්‍යඤ්ජනෙ, සරෙක්වචි" යනමේ සූත්‍රගණයෙන් විහිවූපරිදෙන් සංහිතා සිද්ධයි×

මෙයින් ලොප ආගම ආදෙස දීඝ හ්‍රස්ව විකාර ප්‍රකෘති වසයෙන් ස්වරය, බ්‍යඤ්ජනය, බින්දුය. ප්‍රකෘතිය, යන සිව්වැදෑරුම් සංහිතාවෝ දක්වනලදහ.

ඉති සන්ධිකප්පො සමත්තො

---

5 බුධ පුම යුව සනත රාජ බ්‍රහ්ම සඛා ච සා
යතාදිදෙහිජනතුව සත්තුපිතාභිභූවිද්ද.

බුධපුමයුවසනතරාජබ්‍රහ්මසඛාවසා - බුධ, පුම, යුව, සනත, රාජ, බ්‍රහ්ම, සඛ, සා, යනමේශබ්දයෝද—යතාදිදෙහිජනතුව සත්තුපිතාභිභූවිද්ද-යති, ආදි, දෙහි, ජනතු, සත්තු, පිතු, අභි භූ, විද්ද යනමේ ශබ්දයෝද පුල්ලිඞ්ගයෙහි-අවණ්ණ, ඉවණ්ණ, උවණ්ණ, වසයෙන් ත්‍රිඅන්තයෝවෙත්— එහි, බුධ පුම, යුව, සනත, රාජ, බ්‍රහ්ම, සඛ, යනමේශබ්ද සදෙන අකා

---

* ඉසිංසො–සිසමහර

× සළභතාරං සළඅදසං යනාදිය සොභතාරං; සොළසං. තියාසංහිතාහොව ''සරෙක්වචි'' යන්නෙන් ප්‍රකෘතිවූනැති- එවැනතක් මේහයෙහි හිඳේදෝයි සලකාවා,

රානාමැයි; සම්භාවනරූපනාමනුවයෙන් ගත්තාලද්දැග—
ඊකාරාන්තව පැමිණෙනෙන් හෙ ශබ්දය පරිණති පුංසකී
බැවින් නොගන්නාලදි එකාරාන්තශබ්දයක් නදී නැත්

6 සාඛදුස්; මිම්ා රත්ති පී පොක්ඛරණී නදී රුමා තුභූ
නපුංසකෙ වියන්නාව පදකම්මිදධායුධනො.

සඛාසඛ, අම්මා රත්ති පී පොක්ඛරණී නදීරුමාතුභූ—සඛාසඛ, අම්මා, රත්ති, පී පොක්ඛරණී, නදී, උරු, මාතු, භූ, යන මේ ශබ්දයෝ ස්ත්‍රීලිංගයෙහි, ආකාර, ඉවණ්ණ, උවණ්ණ, වශයෙන් අන්ත පසක් ඇත්තාහු වෙත්—එයි, සඛාසඛ, අම්මා, යනශබ්දවය, ආකාරාන්තායි, රත්තියනු ඉකාරාන්තායි—පී, පොක්ඛරණී, නදී, යනශබ්දත්‍රය ඊකාරාන්තායි උරු, මාතු යන ශබ්දවය උකාරාන්තායි—භූ, යනු ඌකාරාන්තායි—නපුංසකලිංගයෙහි, පදකම්මිදධායුධනො—පද, කම්ම, දධි, ආයු යනශබ්ද වශයෙන්; තියනතාඑව අකාර, ඉකාර, උකාර යන අන්තයක් ඇත්තාහු එහි පද, කම්ම, යන ශබ්දවය අකාරාන්තායි, දධි, යනු ඉකාරාන්තායි; ආයු. යනු උකාරාන්තායි.

7 ගණිතා ගණනෙනතෙ ද්වෙ සනදුතත්තා දුමෙ
විමලා හොනති ජාතෙනතු සි ඵවපවනෙනතහි දසිකා

එසේ, ත්‍රිවිධ ලිංගය යන වොවුන් අතුරෙන්, සුවෙදුමෙ, අමිශ්‍ර පුංලිංගයෙහි, ජාතෙනති, කවිඅනන්තයන් කරණකොටගෙණ, ගයගෙණනයකිතා, ග්‍රහණයෙන් නොහොත් ගණීතයෙන්ගත්තා ලද්දාවූ, සිආදි අනතයා, සි ආදිවිභක්ත්‍යන්තිකයෝ, විමලාහොනති, තුන්සිය සූපණසෙකි

ඒ මෙසේයි, බුධ ශබ්දයෙහි 23 පුමශබ්දයෙහි 26 යුව ශබ්දයෙහි 22 සනත ශබ්දයෙහි 36 රාජ ශබ්දයෙහි 34 බ්‍රහම ශබ්දයෙහි 10 සඛ ශබ්දයෙහි 26 සා ශබ්දයෙහි 23 ය ත්‍රීශබ්දයෙහි 31 ආදි ශබ්දයෙහි 4 දෙශි ශබ්දයෙහි 28 පිතු ශබ්දයෙහි 20 අභිභූ ශබ්දයෙහි 6 විදූ ශබ්දයෙහි 5 —— එසං, පුංලිංගයෙහිවූ සලි පවඅනෙනතහි, පස් වැදෑරුම් අනතයන් කරණ කොටගෙණ දසිකා, එක්සිය අටඅනුවක්වෙති ඒමෙ

ශේයි, කඤ්ඤා ශබ්දයෙහි 22 අච්ඡරා ශබ්දයෙහි 7 රත්ති ශබ්දයෙහි 23 ඉත්ථි ශබ්දයෙහි 25 පොක්ඛරණී ශබ්දයෙහි 4 නදී ශබ්දයෙහි 31 දාරු ශබ්දයෙහි 22 මාතු ශබ්දයෙහි 37 භූ ශබ්දයෙ 22

නපුංසකා පයොගාතු ජනකා හොන්ති. තථාගතා
පධානානුගතා සබ්බනාමසමාසතද්ධිතා.

8 නපුංසකෙ, නපුංසකලිඞ්ගයෙහි; පයොගාතු, ප්‍රයොගයෙ.වනාහි; තථාගතො, අකාර ඉකාර උකාර යනඅන්ත ත්‍රය වසයෙන්; ජනකාහොන්ති, අටදුරා සියෙක්වෙත් — ඒමෙසේයි, පද ශබ්දයෙහි 25 කම්ම ශබ්දයෙහි 31 දධි ශබ්දයෙහි 26 ආයු ශබ්දයෙහි 26. සබ්බනාමසමාසතද්ධිතා, සබ්බනාම සමාස තද්ධිත යනමොව්හු; පධානානුගතා හොන්ති, ප්‍රධානයා අනුව ගියාහු වෙත් නොහොත් විශෙෂ්‍යයාගේ ලිඞ්ගවචන අනුවර්ත්‍යාහුවෙත්; ඒ මෙසේයි—සබ්බො ජනො, සබ්බෙ ජනා, සබ්බා පජා, සබ්බං ධනං, සො භික්ඛු, සා කඤ්ඤා, යං පදං, යනාදිවසයෙනි; තුම්හ අම්හ ශබ්ද යෝද්‍ය කලී ත්‍රිලිඞ්ගයෙහි අවිශෙෂයෝයි – එනමුදු උවත් ත්‍රිවිධ ලිඞ්ගයෙහි රූපභෙදයාගේ අභාවයෙන් අලිඞ්ගයයි කියත් බව්හුද "ත්වමහං සිම්හිච මයං යොම්හිපඨමෙ" යනාදිසූත්‍රාගත රූපයෙන් සිද්ධයෝයි.

මෙහි සමාසයයි භූයොවෘත්තියෙන් දිසන්තරලාභ හැර බහුව්‍රීහිද කිසිතත්පුරුෂයක්ද ගතයුතු, ඒ මෙසේයි, පසන්නං උදකං යං,සා පසන්නාදිකා-නදී-පසන්නාදකො-නාලො, පසන්නාදකං-සරං මේ ආදීනයින් බහුව්‍රීහිද-තත්පුරුෂයෙහි, භික්ඛුසඞ්ඝස්ස, සාගු-භික්ඛුසඞ්ඝො, බද්ධො-භික්ඛුසඞ්ඝපවං, ඥතං-ආදියද ගතයුතු—මෙහි සාමාන්‍ය වෘත්තිතද්ධිත ගතයුතු, වාසිබො-වාසිසී ආදියද-මාතිසං මංසං-. මාහි යි, සන්තානිකා, * මෙම අර්ථය අනන්තවාරිගුද කියත්

"නීලාදිගුණනාමංච බහුබ්බිහි ච තද්ධිතා
සාමඤ්ඤවුත්තතව්‍යතීතාදි කිත නාමා වාච්චලිඞ්ගකා.

නීලාදිගුණනාමච, නීල පීත ලොහිතඅවදාත මාජිෂ්ඨ ගුරුලඝු යනාදීවූ ගුණනාමද, බහුබ්බිහිච, සුගන්ධ සුරූපාදීවූ බහු

* දඩනදීයෙන් උපරිමභාගයයෝ යොඳෙයි

ද්විගුසමාසයද; සාමාන්‍යවූ නපුංසකලිඞ්ගතව, ගොත්‍රාදිසාමාන්‍ය යෙහි දූවෘත්තිමත් වාශිෂ්ඨාදි තද්ධිතද" අපච්චතද්ධිත ප්‍රත්‍යයා නපුංසකාදසිද්ධයි; අනිත්‍යාදිලිඞ්ගතා නතා, අනිත්‍යානාඩතාදිවූ නියත ලිඞ්ගරහිතවූ සිතක ප්‍රත්‍යයාන්තයෝද්දයි යනමොවුහු සරොෂහා තුල්‍ය ආංග වර්ජිත සංඥීදින්නෝම වාච්‍යලිඞ්ගකා, විශෙෂ්‍යභූතඅර්ථයට බඳුවූ ලිඞ්ගඇත්තෝයි; නීලො පටො, නීලා භූමි, නීලං උප්පලං, සුගන්ධො චම්පකො, සුගන්ධා සාලා; සුගන්ධං චන්දනං, වාසිට්ඨො පුරිසො, වාසිට්ඨී කඤ්ඤා, වාසිට්ඨං, කුලං, අතීතො කාලො, අතීතා රත්ති, අතීතං චිත්තං; යනාදීන්සෙදියයුතු

9 අනෙකලිඞ්ගා නිපාතාදී තතො ලුත්තාව සහදයො
සුතානුරූපතො සිද්ධා ඤෙයා නාම වත්තමානාදයො.

නිපාතාදී, නිපාතාදීහු; අනෙකලිඞ්ගා, ලිඞ්ගත්‍රය නැත්තාහුයි; තතො, ඔවුන්කෙරෙන්; සහදයො, සිආදීහු; ලුත්තා එව, ලුප්තවූවෝමවෙති; වත්තමානාදයො, වර්තමානාදීහු; සුතානුරූපතො, සූත්‍රානුරූපයෙන්; සිද්ධා හොන්ති, සිද්ධ වූවෝ වෙත්.

ඉති නාමකණ්ඩො සමත්තො.

---

10 ඡකාරකෙ සසාමිස්මිං සමාසො හොති සම්භවා
තද්ධිතො කත්තුකම්මෙ ච සම්පදානොකාසසාමිසු

සමාසො, සමාසයතෙම; සසාමිස්මිං, සම්බන්ධයසහිතවූ; ඡකාරකෙ, ෂට්කාරකයෙහි; සම්භවා, සම්භවූපරිද්දෙන්; හොති, වේ; තද්ධිතො, තද්ධිතයතෙම; කත්තුකම්මෙව, කර්තෘකර්මදෙක්හිද; සම්පදානොකාසසාමිසු, සම්ප්‍රදාන ඔකාස සාමි යන මෙහිද සම්භවූපරිද්දෙන්වේ.

ඒමෙසේයි

රඤ්ඤො පුත්තො=රාජපුත්තො, ආනන්දාසමණ යං, සො - ආගන්තුකමින්ණෙ විහාරෙ—වාක්‍යයෙහි පැවති විශෙෂණවූ ආනන්දසබ්දය විශෙෂ්‍ය සමණසබ්දය යන මොවුන් විසින්

කියයුතු ආගමන සමණ අර්ථයන් හැර ආනත ශබ්දයාගේ කර්මවූ විහාරසංඛ්‍යාත ද්‍රව්‍යයෙහි වැටේනුයි උපනතකම්මත් සෙසු තන්හිද මෙසේමැයි.

උපනතකත්තෘ, ජිතානි ඉන්ද්‍රියානි යෙන සො=ජිතින්ද්‍රියො මුනි;

උපනතකරණ, ඡින්නා රුක්ඛා යෙන, සො, ඡින්නරුක්ඛො, ඵරසු.

උපනතසම්ප්‍රදාන, දින්නො සුඞ්කො යස්ස සො දින්නසුඞ්කො, රාජා,

උපනතාපාදාන, නිග්ගතා ජනා යස්මා සො නිග්ගතජනො ගාමො,

උපනතාධාර, සම්පන්නානි සස්සානි අස්මිංති=සම්පන්නසස්සො, ජනපදො; සම්බන්ධයවූකලී විශෙෂණයා කෙරෙන්ම වෙයි විශෙෂ්‍යයා කෙරෙන් නොවේමය එසේවූ සම්බන්ධය භාණ්ඩ සම්බන්ධය සාමිසම්බන්ධය යනාදී තන්වැදෑරුම්,

මෙහි සමාස යන්නෙන් බහුව්‍රීහි සමාසය ගන්නාලදී; බහුසමාසය සමුච්චය සමාහාර දෙක්හිද දිගු කම්මධාරය යන දෙක එම අර්ථයෙහිම පවතින්, අව්‍යයීභාව තත්පුරුෂ දෙක කිසිතැනෙක්හි අධිකාරකයෙහි හා සාමියෙහි පවතී ඒ දැක්ම විභක්ති ලොපවශයෙනි — මේසඳහා ටීකා නි.

ඵලෙනෙත.දිගුණා කම්මධාරයෙන සමුච්චයො
තස්සත්ථෙ දිපසාදාසනා තෙවුත්තොපනාකාරකා
සාමිනුතෙනා බ්‍යයීභාවම්භාදිවුත්තනා සකාරකා
තද්දීපකාවිභත්තීනං ලොපලෙසානුමීනනො

ත්‍රිඩිතය-පදවිධ අර්ථයන්හි පවති එමෙසේයි, අභිධම්ම. අධීතෙති ආභිධම්මිකො භික්ඛු—මෙහි අධීතෙ යනුහා සමානාධිකරණහියෙන් කත්තෘ ගැනේ.

උපනතකම්ම, ආගතාසංසමණො ආගතිකො ආරාමො.

උපනතසම්ප්‍රදාන, දක්ඛිණා යස්ස අරහති දිය්‍යතෙතිවා දක්ඛිණෙය්‍යො භික්ඛු.

උපනතාධාර, යස්මිං රුක්ඛා සන්ති සො-රුක්ඛවා-දෙසො

උපනතසාමි-වීණා අස්ස සිප්පායති වෙණිකො, භණ්ඩෙබ්බා.

භාසව ඵ තුඤ්ඤං සි කරණපවත්තිදෙකද කිසිතැනක පෙ ණේ කසාවෙනරත්තං, එනතො සම්භූතං, සි විග්‍රහයි. එහෙ යින්ම ඔයෙන සි කියත්, බාලාවතාරාදියෙහි "තතියො ලබ්භ ගෙ ඔයෙන කරණවත්තිවජ්ජිතෙ" යි.

11 සාධනානම්හි ආධාරතො කිතකො සුතසාධනෙ
සබ්බත්ථ පඨමා වුත්තෙ අවුත්තෙ දුතියාදයො

ආධාරයො, ආධාරකයනෙව; සාධනානම්හි, කර්තෘකර්ම භාවයන්හි සාධනතුයෙහිද; කිතකො, කිතකයනෙව්; සතාසාධනෙ අධිකාරකය හා භාවය යන් සතසාධනයෙහිද වේ; වුත්තෙ සබ්බත්ථ, උක්තසකලස්ථානයෙහි; පඨමා, ප්‍රථමාවේ; අවුත්තෙ, අනුක්තයන්හි; දුතියාදයො, විතියාදීහු වෙත්.
ඒවෙමයි
සාධනත්‍රයෙහිවූ ආධාරකය - සුදෙ බදනො පචති-සූදෙන බදනො පච්චතෙ-සූයතෙ දනෙනන - යනාදිවසයෙනි
කිතකය, කර්තෘයෙහි පුඤ්ඤං කරොතීති - පුඤ්ඤකා රො පුමා
කර්මයෙහි, බුද්ධෙන දෙසිතො ධම්මො.
කරණයෙහි, පහරන්ති යෙනාති තං පහරණං ආයුධං.
සම්ප්‍රදානයෙහි, යස්ස සම්මා පදීයතෙ සො, සම්පදනො, බ්‍රාහ්මණො * අපාදනයෙහි යස්මා භීයතෙ භායනාතිවා - සො භීමො, රණබසො.
ආධාරයෙහි, යස්මිං ආසනාති තං ආසනං පීඨං
භාවයෙහි, සයිතබ්බංභවතා - යනාදීහුමයි.
උක්තකර්ම, සූදෙන බදනො පච්චතෙ-බුද්ධෙන දෙසිතො ධම්මො, මෙහි පච්චතෙ යන තන්හි, ආඛ්‍යාත නෙවිභක්ති ද, අදෙසි යිසුවාහි දෙසිතො යි, කිතක තද්ධිතප්‍රත්‍යයද කර්මයෙහි කරණ ලදහෙයින් ඒකර්මය උක්තනම් - එහි ද්‍රථමාවිභක්ති මවේ යම් කර්මාදිවූ අර්ථයක් කිවමනාකල්හි සමාසාදිය නො ලත් අර්ථය අනුක්ත නම් එහෙයින් කර්මයෙහි විතීයා යනාදී වසයෙන් යෙදියයුතු- මේ සඳහා ටීකායෙහි
වුත්තෙන කම්මාදිකාමිසම්ං ලිඞ්ගත්ථෙ පඨමාසියා-
අවුත්තෙ තු භවිතතාඤ්ඤා දුතියාදී යථාරහං'

---

* බාල වතාරයෙහි, සම්පදානං බුද්ධො

12 ජිතත්තා මුනිනො වුත්ත වනෙ බුධෙන වණ්ණිතෙ
වට්ටා භීතො විවට්ටත්ථං භික්ඛු භාවෙහි භාවනං.

වට්ටාභීතො භික්ඛු, සංසාරවෘත්තීන්බාශීය මහණතෙම; විවට්ටත්ථං, නිවන්සඳහා; බුධෙනවණ්ණිතෙවනෙ, බුදුන්විසින් වණ්ණිත වූවනෙහි, මුනිනො, මුනීන්ද්‍රයන්ගේ; වුත්ත, වදාළ වචනය හේතුකොටගෙණ; මනසා, උපාය මනසිකාරයෙන්; භාවනං භාවෙහි, භාවනාවඩයි.

ලිඞ්ගාර්ථ කර්මාර්ථාදීන්ගේ උපලක්ෂණ සාමර්ථ්‍යයෙන් ප්‍රයොග දක්වනුසඳහා මේ කියති හෙවත් කර්මාදීන්ගේ අනුක්‍රමයෙහි උදාහරණසඳහායි — මනසා බුධේන. යන දෙතැන කරණ කර්තෘදෙක්හි තෘතීයායි, මුනිනො යනු ෂෂ්ඨියි, වුත්ත වට්ටා යන දෙතැන පඤ්චමියි, වනෙ වණ්ණිතෙ යන දෙතැන සප්තමියි, විවට්ටත්ථං විවට්ටායයි සම්ප්‍රදානයි, භාවනං යනු ද්විතීයායි, මේ සියලු අනුක්‍රමයෙහි උදාහරණයි, භීතො භික්ඛු යනු උක්ත කර්තෘයි, භූ ධාතු අකර්ම්මක ලවත් මෙහි හෙත්වර්ථවාරයෙන් සකර්ම්මකයි.

ඉති කාරකකප්පො සමත්තො

---

13 රාසි ද්විපදිකා ද්වන්ද ලිඞ්ගතො වචනෙන ච
ඌනාතුල්‍යාධිකරණා බහුබ්බිහි තු බෙම්ර

ද්විපදිකාද්වන්ද, පදදෙකක්ඇති ද්වන්ද්වයෝ; ලිඞ්ගතො වචනෙන ච, ලිඞ්ගය හා වචනයත් කරණකොටගෙණ; රාසි, දෙසැත්තෑභෙදයකි; බහුබ්බිහිතු, බහුව්‍රීහිසමාසයි; ඌනාතුල්‍යාධිකරණා, ඌනාතුල්‍යාතුල්‍යාධිකරණ භින්නාධිකරණ භෙදයෙන්; බෙම්ර, දෙසිය දෙපණසකි.

ඒමෙසේයි, ඉතරීතරයෝගයෙහි පුල්ලිඞ්ගානත දෙලස, සාරිපුත්තො ච මොග්ගල්ලානො ච–සාරිපුත්තමොග්ගල්ලානා; සමුද්දො ච පබ්බතා ච–සමුද්දපබ්බතා; පුත්තො ච දාරො ච-පුත්තදාරා; සමණා ච බ්‍රාහ්මණා ච-සමණබ්‍රාහ්මණා; මාතා

ච පිතා ච-මාතාපිතරො; අවිජ්ජා ච සංඛාරා ච-අවිජ්ජා සඞ්ඛා
රා; ජායායො ච පතිකො ච-ජායාපතිකා; නාරියො ච නරා
ච-නාරීනරා; දොමනස්සං ච උපායාසො ච-දොමනස්සුපායා
සා; චිත්තං ච චෙතසිකා ච-චිත්තචෙතසිකා; උපාදානානි ච
භවො ච-උපාදානභවා; ඣානානි ච මග්ගා ච-ඣානමග්ගා;

ස්ත්‍රීලිඞ්ගාන්තදෙළස, සද්ධා ච චෙතනා ච-සද්ධා
චෙතනා; ගඞ්ගා ච කුන්නදියො ච-ගඞ්ගාකුන්නදියො; දාසි
යො ච භරියායො ච-දාසිභරියායො; අඤ්ඤායො ච සමා
පත්තියො ච-අඤ්ඤසමාපත්තියො; පුත්තා ච ධීතා ච-
පුත්තධීතරො; නරා ච නාරියො ච-නරනාරියො; රාජානො
ච කඤ්ඤායො ච-රාජකඤ්ඤායො; කුමාරා ච ඉත්ථියො ච-
කුමාරිත්ථියො; දස්සනං ච භාවනා ච-දස්සනභාවනා; පබ්බ
තානි ච කුන්නදියො ච-පබ්බතකුන්නදියො; නිබ්බාණං ච
පඤ්ඤත්තියො ච-නිබ්බාණපඤ්ඤත්තියො; ඵලානි ච නිබ්බු
තියො ච-ඵලනිබ්බුතියො;

නපුංසක ලිඞ්ගාන්තදෙළස, සම්පටිච්ඡනං ච සන්තිරණං
ච-සම්පටිච්ඡනසන්තිරණානි; වොත්ථපනං ච ජවනානි ච-
වොත්ථපනජවනානි; ඵලානි ච නිබ්බාණං ච-ඵලනිබ්බාණා
නි; ඉන්ද්‍රියානි ච බලානි ච-ඉන්ද්‍රියබලානි; ඡන්දො ච විරියං ච-
ඡන්දවිරියානි; ඛන්ධා ච නිබ්බාණානි ච-ඛන්ධනිබ්බාණානි;
සංඛාරා ච විඤ්ඤාණං ච-සංඛාර විඤ්ඤාණානි; මග්ගා ච ඵ
ලානි ච-මග්ගඵලානි; විමුත්ති ච විමුත්තිඤාණ දස්සනං ච-
විමුත්තිවිමුත්තිඤාණ දස්සනානි; තණ්හා ච උපාදානානි ච-
තණ්හුපාදානානි, වාලුකායො ච උදකං ච-වාලුකොදකානි;
විජ්ජා ච චරණානි ච-විජ්ජාචරණානි;

සමාහාරයෙහි පුල්ලිඞ්ගාන්තදෙළස, කාකො ච උලූ
කො ච-කාකොලූකං; උරගො ච අනබකො ච-උරගබකං; ද
න්තා ච ඔට්ඨා ච-දන්තොට්ඨං; හත්ථිනො ච අස්සා ච-හත්ථි
ස්සං; දාසී ච දාසො ච-දාසිදාසං; දාසී ච දාසා ච-දාසිදාසං;
දාසියො ච දාසා ච-දාසිදාසං; ඉත්ථියො ච පුරිසා ච- ඉත්ථිපුරි
සං; කඨං ච කලාපො ච-කඨකලාපං * ; උදකං ච දන්තපො

* උදාහරණ කඨකාලාපම්=කඨාශ්චකාලාපාශ්ච

නං ච-උදකද්දනනපොතනං; වත්ථානි ච අලඞ්කාරෙ ච-වත්ථාලඞ්කාරං; වත්ථානි ච අලඞ්කාරා ච-වත්ථාලඞ්කාරං;

ස්ත්‍රීලිඞ්ගානනදෙළස, දක්ඛිණා ච උත්තරා ච-දක්ඛිණුත්තරං; දරී ච ගුහායො ච-දරිගුහං; දරියො ච ගුහා ච-දරිගුහං; වඞ්ගුලියො ච ගොලිකායො ච-වඞ්ගුලිගොලිකං; සමථො ච විපස්සනා ච-සමථවිපස්සනං; ඛන්ධා ච සාඛායො ච-ඛන්ධසාඛං; කණ්ණා ච නාසා ච-කණ්ණනාසං; කුන්ථා ච කිපිල්ලිකායො ච-කුන්ථකිපිල්ලිකං; මුඛං ච නාසිකා ච-මුඛනාසිකං; ඡත්තඤ්ච උපාහණායො ච-ඡත්තුපාහණං; තිණානි ච ලතා ච-තිණලතං; මූලානි ච සාඛායො ච-මූලසාඛං;

නපුංසකලිඞ්ගානනදෙළස, චක්ඛුං ච සොතං ච-චක්ඛුසොතං; පුප්ඵං ච ඵලානි ච-පුප්ඵඵලං; පුප්ඵානි ච ඵලං ච-පුප්ඵඵලං; උසීරානි ච බීරණානි ච-උසීරබීරණං; පත්තො ච චීවරං ච-පත්තචීවරං; ඛන්ධො ච මූලානි ච-ඛන්ධමූලං; සරා ච තූණීරං ච-සරතූණීරං; අජා ච බ්‍යජනානි ච-අජබ්‍යජනං; ජරා ච මරණං ච-ජරාමරණං; ඡවි ච මංසානි ච-ඡවිමංසං; සත්තියො ච ඵලකං ච-සත්තිඵලකං; සාඛායො ච පලාසානි ච-සාඛාපලාසං *

---

* මේ සමාසයෙහි අනෘවුද නොයෙක් විභාගලැබෙයි නිරුත්තිනයින් "පාණීතූරිය යොග්ගසෙනඞ්ගානං නිච්චවෙරීනං සඞ්ඛ්‍යාපරිමාණසඤ්ඤානං ඛුද්දජන්තුකානං පචනකචණ්ඩාලානං චරණසාධාරණානං එකජ්ඣායනපාවචනානං ලිඞ්ගවිසෙසානං විවිධවිරුද්ධානං දිසානං නදීනඤ්ච නිච්චං සමාහාරෙකත්තං සම්භවති"

මෙහි, පාණ්‍යඞ්ග තූරියඞ්ග යොග්ගඞ්ග සෙනඞ්ග යන සතර ආකාරයෙහි ශබ්දදෙකක්තුනක් වැඩියකුත් සමාසව එකත්ව නපුංසකත්ව ලබයි, "චක්ඛුසොතං-මුඛනාසිකං" මෙහි දෙක දෙකමැයි "ඡවිමංසලොහිතං" මෙහි තුනෙකි. මෙසෙයින්ම සඞ්ඛපණවදෙණ්ඩිමං ආදියද දතයුතුයි. තවද හත්ථී ච අස්සා ච-හත්ථස්සා; මෙහි එකඑකා වුකල බහු වචන පෙණෙයි "හත්ථිනො ච අස්සා ච යි බහුවචනාන්තපදසමාසවිනම් හත්ථස්සං යි එකත්ව නපුංසකත්ව නියතයි.— මෙම අර්ථය අමාසඞ්ගහීහයෝද සවුට කෙරෙති

ඉත්ථිසි චිත්‍රගවාදී පදවසයෙන් සමාස කරණලද බහුව්‍රීහි සමාසයෝ එසේම ගණින් ගණිත්. බහුව්‍රීහියවූකලී තද්ගුණ සංවිඥානය අතද්ගුණ සංවිඥානයයි දෙ වැදෑරුම්වේ. අර්ථවසයෙන්ද විග්‍රහභෙදයි. ශබ්දලක්ෂණ වසයෙන් එකත්මය විභක්ත්‍යන්තවසයෙන් ෂඩ්විධවෙයි. එහි තෘතීයාදීය කාරකකරණ වසයෙන් දෙවැදෑරුම්වේ; මිනවයෙහි මෙන් සතිස් ව්‍යතිමිශ්‍රක නය සතින් ගණනලද්දාහු බහුව්‍රීහි සමාසයෝ දෙසිය දෙපණසක්වෙත්

---

අනුවාදෙ චරණානං ස්ථෙණ්‍යද්‍යතනිප්‍රයොගවිෂයාණාම්
අනපුංසකලිඞ්ගානාං යජුඃක්‍රතූනාංච නිකටපාඨානාම්

අප්‍රාණිජාතිවිසදෘශලිඞ්ගනදීදෙශනගරාණම්
ශාශ්වතිකවෛරිණාමථ කාරූණාම් ප්‍රාණිතූර්‍ය්‍යාඞ්ගානාම්

සෙනාඞ්ගානාංච බහුත්වෙ භවති ක්‍ෂුද්‍රජන්තුකඵලානාම්
වෘක්ෂතෘණධාන්‍යමෘගශකුනිවිශෙෂාණාම් විභාෂෛව ;

ව්‍යඤ්ජනවිශෙෂකාණාං සාදුවතාණං විරොධිනාංච සමිතා
තෙෂාංච සමාහාරෙ දධිපයසාං බඞ්ගු භවෙදන්‍යඃ.

ස්ථේණ්, ස්ථා ගතිනිවෘත්තෞ ඉණ් ගතෞ යන ධාතූන් දෙදෙනාගේ; අද්‍යතනීප්‍රයොගවිෂයාණාම්, අද්‍යතනීකාලප්‍රයොග ගොචරකොටඇති; චරණානාම්, වෙදශාඛා හදුරන්නන්; අනුවාදෙ, සංකීර්තනයෙහිද; * යජුඃක්‍රතූනාම්, යජුර්වෙදයෙහි කියනලද සොමයාගවාචයවූ; අනපුංසක ලි

---

* කඨාශ්ච කලාපාශ්ච=කඨකාලාපං; කඨාශ්ච කෞථුමාශ්ච=කඨකෞථුමං, මේ එකත්ව නපුංසකත්වය ඉණ් ධාතුහුගේද ස්ථාධාතුහුගේද අද්‍යතනී ක්‍රියා සම්බන්ධයෙහි පමණක්ම යෙදෙයි ඒ මෙසේයි උදගාත්, ප්‍රත්‍යෂ්ඨාත් යන ක්‍රියා සම්බන්ධයෙහි මුත් අන්තැන්හි නොවේ. අනත්‍යුෂු කඨකාලාපාඃ යනාදී අන්‍යධාතු සම්බන්ධයෙහි ඒකත්ව නපුංසකත්ව නොවෙයි; තවද කඨකලාපං යි නන්වැදෑරුම් පාශ්‍රී ව්‍යාකරණ පොත්වල පෙණෙයි ඒ සවර හේතුවකින් දැයි කල්පනාකෙරේවා- කඨකාලාප යි ජයාදිත්‍යාදී නොයෙක් පණ්ඩිතයන් විසින් දක්වනලදී.

14 තප්පුරිසා ච බේව්හාර ද්සා ච කම්මධාරයා
ඞිගු චාබ්‍යයීභාවා භාර ඒතෙ සබ්බපි භාරිතා

තප්පුරිසාච, තත්පුරුෂසමාසයෝද; බෙමොරා, දෙසියදෙපණසමය; කම්මධාරයාච, කර්මධාරයසමාසයෝද; දසා, අටලොසකි; දිගු, දිගුසමාසය; ච, සයකි; අබ්‍යයීභාවා, අව්‍යයීභාවයෝ; භාරා, අටවිස්සකි; එතෙසබ්බෙපි, මොහුසියල්ලෝම, භාරිතා, හසිය අටවිස්සකි — යම්පරිච්ඡේදකින් බහුව්‍රීහි සමාස ප්‍රයොගයෝ ගණිතලද්දාහුද, එසේම තත්පුරුෂ සමාස ප්‍රයොගයෝ සංඛ්‍යා කටයුතු. භේදවනාහි ද්විත්‍යාදි ෂට් විභක්තීන්හි සම්භවන හෙයින් ද්විත්‍යා තත්පුරුෂාදි වසයෙන් ෂට්විධවෙයි †

---

ධීහානාම්, නපුංසක ලිංගවූ ශබ්දයන්ගේද; නිකටපාඨානාම්, පරස්පර සමීපවාසීන්ගේද; අප්‍රාණිජාති, ප්‍රාණිරහිත වර්ගයන්ගේද; විසදෘශලිංග නදීදේශ නගරාණම්, සිංහාලි ඛහිකවූ නදීවිශෙෂය ගම්ගැර දෙශවිශෙෂය යන මෙතෙක් දෙනාගේද; ශාශ්වතික වෛරිණාං. ප්‍රකෘතියෙන් පැවති සදාකාල විරොධ ඇත්තවුන්ගේද; අථ, වැලි; කාරුණාම්, ශිල්පීන්ගේද; ප්‍රාණි තූර්‍ය්‍යකාධිහානාම්, ප්‍රාණ්‍යඞ්ග තූර්‍ය්‍යඞ්ග යනමොවුන්ගේද; සෙනාඞ්ගානාංච, සෙනාඞ්ගයන් ගේද; ක්ෂුද්‍රජන්තුක ඵලානාම්, කුඩාසතුන්ගේද ඵලයන් ගේද; බහුලෙව, බොහෝ බැවිහි; භවති, එකත්‍වං නපුංසකත්‍වයවේ — වෘක්ෂ තෘණ ධාන්‍ය මෘගශකුනිවිශෙෂාණාම්, වෘක්ෂය තෘණය ධාන්‍යය මෘගය ලිහිණිය යන විශෙෂයන් ගේද; ව්‍යඤ්ජන විශෙෂකාණම් (දී ගිතෙල් ආදී) විවිධව්‍යඤ්ජනයන්ගේද; විරොධිනාම්, උනුන් විරුධවූ; අද්‍රව්‍යාණාංච; අද්‍රව්‍යයන්ගේද; සමතා, සමබැව්වෙයි; තෙෂාංච සමාහාරඃ, (තවද) ඔවුන්ගේ සමාහාරය; විභාෂාඑව, විකල්පයෙන්ම වෙයි; දධිපයසාං, දී කිරිආදීන්ගේ වනමය; බලු, එකාන්තයෙන්; අන්‍යඃ භවෙත්; අනිකෙක්මවතොත්යි හෙවත් බහුවචනම වෙයි.

† උපසර්ගාදිවව්ධාවශ්ව, යනාදි පාණිනීය සූත්‍රක්‍රමයෙන් ක්‍රියාගොගයෙහි ලැබෙන්නාවූ සමාසයෝද තත්පුරුෂසංඥ

ඉක්බින්නෙන් ලිඞ්ගවෘත්තිමිශ්‍රකවිසංඥෙන් ලිඞ්ගවචනයන් සරණකොටගෙණ කර්මධාරය සමාසයෝ ගණිනුලැබෙත් මෙහිවූකලි වචන මිශ්‍රකයෝ නැත්තානුද සමානාධිකරණ බැවින් ඒකවිභක්තිකවෙයි

---

ඇත්තානා-උරරී; ඌරී, ඌරරී, මේ නිපාතත්‍රය පිළිගැන්මෙහි විස්තාරයෙහි වැටේ, ඉදිරියෙහිවූ කෘ ආදි ධාතූන්හා සමාසව උරරීකරෙති උරරීකෘත්‍ය යනාදිය සිඬවෙයි, පාපී තාලී ආතාලි ශෛවතාලි ධූමී ශකලා සංශකලා ධ්වංසකලා භ්‍රංශකලා, මේ නිපාත හිංසාර්ථයි මෙද පාපීකරෙති පාපීකෘත්‍ය යනාදී ක්‍රමයෙන් සමාස වනබව කියත්, ගුළුගුධා පීඩාර්ථයෙහි. සජ්ජූඃ සහාර්ථයෙහි මෙද උක්තාර ක්‍රියාවන්හා සමාස වෙයි; එළූ එලී විකලී ආකලී, මේ සතර විකාරාර්ථයෙහි- ආලොෂ්ටී කරාලී කෙවාලී ශෙවාලී වර්තාලී මශ්මසා මසමසා මේ සතද හිංසාර්ථමැයි-වෂට් වෞෂට් ශ්‍රෞෂට් ස්වාහා ස්වධා බන්ධා ප්‍රාදුස් ශ්‍රත් ආවිස් මොවුහුද ඉදිරි ක්‍රියාවන්හා සමාසවෙති—වෂට්කරෙති වෂට්කෘත්‍ය යනාදි වසයෙනි මෙද තත්පුරුෂමැයි. ච්විප්‍රත්‍යයාන්තයෝද ශුක්ලීකරෙති ශුක්ලීකෘත්‍ය ශුක්ලීකෘතං ආදික්‍රමයෙන් තත්පුරුෂ මැයි; ඩාච් ප්‍රත්‍යයාන්තයාවූකලි අනුකරණ ශබ්දයන්ගෙන් පරව ඉදිරි ධාතූන්හා සමාසවෙයි යේ මෙසේයි—පටපටාකරෙති පටපටා කෘත්‍ය පටපටා කෘතං මේ ආදී තවදුරටත් ඉතාවිශාලව දක්වති ග්‍රන්ථවිස්තාරභීත්‍යන් උපෙක්ෂාවිමු

තවද "අත්‍යාදයඃ ක්‍රාන්තාද්‍යර්ථෙ ද්විතීයයා" අතිආදී අව්‍යයෝ ඉක්මීම්ආදිඅර්ථයෙහි ද්විතීයා විභක්තියහා තත්පුරුෂ සමාසවෙයි මෙහි ලිඞ්ගාන්‍යත්වභාව දක්වනායි-අතික්‍රාන්තඃ ඛට්වාම්-අතිඛට්වඃ; "අවාදයඃ ක්‍රුෂ්ටාද්‍යර්ථෙ තෘතීයයා" අවාදීහු ක්‍රොෂණාදි අර්ථයෙහි තෘතීයාහා සමාසවෙයි අවක්‍රුෂ්ටං කොකිලයා-අවකොකිලං; මෙහි නපුංසකතා වන වාච්‍ය බැවිනි "පර්‍ය්‍යාදයො ග්ලානාද්‍යර්ථෙ චතුර්ථ්‍යා" පරිආදීහු ග්ලාන්ආදිඅර්ථයෙහි චතුර්ථී විභක්තියහා සමාසවෙයි පරි

විශෙෂණ පූර්වපදාදි වශයෙන් නවවිධවෙයි * ඒ ප්‍රභේද ආමශ්‍රීනය නොකොට ලිඛිතවචනයන් කරණකොට ගෙණ ප්‍රයෝගයෙහි ගණිනුලැබෙත් ඒ මෙසේයි.

එකො ච සො ආහාරොචාති-එකාහාරො; සංඛාරා චතෙ පච්චයාචාති-සංඛාරපච්චයා; අවිජ්ජාච සා ආසවොචාති-අවිජ්ජාසවො; විභත්තියො ච තා පච්චයාචාති-විභත්තිපච්චයා; විඤ්ඤාණඤ්ච තං ආහාරොචාති-විඤ්ඤාණාහාරො; ඛාන්ති එව ධම්මා-ඛාන්තිධම්මා; පඨවිච සා ධාතුචාති-පඨවිධාතු; ඛත්තියාච තා කඤ්ඤායොචාති-ඛත්තියකඤ්ඤායො; චක්ඛු ච තං ධාතුචාති-චක්ඛුධාතු; මනොවිඤ්ඤාණානි එව ධාතුයොචාති-මනොවිඤ්ඤාණධාතුයො; කායො ච සො ධාතුචාති-කායධාතු; ධම්මා ච තෙ ධාතු චාති-ධම්මධාතුයො; සොතඤ්ච තං ආයතනං චාති-සොතායතනං; නීලානි ච තානි උප්පලානි චාති-නීලුප්පලානි; විනයො ච සො පිටකඤ්චාති; විනයපිටකං; බොජ්ඣඞ්ගාච තෙ ධාතුචාති—බොජ්ඣඞ්ගධාතුයො; බොජ්ඣඞ්ගා ච තෙ රතනානි චාති-බොජ්ඣඞ්ගරතනානි; සද්ධා එව ධනං-සද්ධාධනං; ඉත්ථියො එව රතනානි-ඉත්ථිරතනානි.

ගණන්වාචී ශබ්දයක් පෙරටුකොට ඇති කර්මධාරයම දිගුයයි කියනුලැබේ ඒ දිගුසමාසය සමාහාර අසමාහාර යයි දෙවැදෑරුම්වේ, උන්අතුරෙන් සමාහාරය තමා ජාතිය අපෙක්ෂාකොට ගිණියයුතු දැයගේ ගණනට අනුවර්තිබැවින් ඒක වචනයා නපුංසකලිඞ්ගදවේ, මේ සමාහාර පක්ෂයෙහිවූ

---

ග්ලානොධ්‍යයනායයි-පර්‍යධ්‍යයනං, හැදෑරීමට මැලිතැනැත්තේයි "නිරාදයොගතාද්‍යර්ථෙ පඤ්චම්‍යා" නිර් ආදිහු ගමනාදි අර්ථයෙහි පඤ්චමියනා සමාසවෙයි, නිෂ්ක්‍රාන්තඃ කෞශාම්බ්‍යාඃ-නිෂ්කෞශාම්බිඃ; තත්පුරුෂය මේ ආදිනන්වැදෑරුම්වෙයි.

* විශෙෂණ පූර්වපදය විශෙෂ්‍ය උත්තරපදය විශෙෂණ උභයපදය උපමානුත්තරපදය සම්භාවනා පූර්ව පදය අවධාරණ පූර්ව පදය න නිපාත පූර්වපදය කු පූර්ව පදය ප්‍රාදි පූර්වපදය කියායි

කලී ලිඞ්ග වචනයන්ගේ නානත්වයෙක් නැත් නපුංසක ලිඞ්ග ඒක වචන බැවිනි-සමාස විග්‍රහ වාක්‍යයෙහි පෙණෙයි. ඒමෙසේයි — තයො ලොකා සමාහටා තිලොකං-චතස්සො දිසා සමාහටාචතුද්දිසං-චත්තාරි සච්චානි සමාහටානි චතුසච්චං.

අසමාහාරයෙහි වූකලී ගණින්ලබන විශේෂ්‍යය අනුවර්තිය බැවින් විග්‍රහවාක්‍යයෙහි සහ සමාසය යන දෙතැන්හිම බහුවචනවෙයි ඒමෙසේයි, තයො භවා තිභවා-චතස්සො දිසා චතුද්දිසා-චත්තාරි සච්චානි චතුසච්චානි.

අව්‍යයීභාව සමාසයෙහිවූ කලී සමාසයට ප්‍රධානවූ අව්‍යයන් අලිඞ්ගයෙයින් වචනයෙන් පමණක්ම සමාසයන් ගණිති— මෙනි අභාවො මක්ඛිකානං නිම්මක්ඛිකං, යනාදිය පදත්තරයෙහිද යෙ යෙ බුඩ්ඪා-යථා බුඩ්ඪං, යනාදිය අර්ථයෙන් දැයි කීසා විග්‍රහ වාක්‍යය දෙවැදෑරුම්, උපකුම්භං උපගඞ්ගං උපනගරං යනාදියෙහිවනාහි කුම්භ ගඞ්ගා නගර ශබ්දයන් තමන් අප්‍රධාන බැවින් නොගණිනු ලැබෙත්; එකවචනයෙන් එකවචනය එකවචනයෙන් බහුවචනය බහුවචනයෙන් එකවචනය බහුවචනයෙන් බහුවචනය යන සිවුවැදෑරුම් භෙදයෙ! සංඛ්‍යාවිභක්තියෙන් ගණින ලද්දාහු අට විසි භෙදව පෙණෙයි, යං යං භූතං— යථාභූතං; යෙ යෙ බුඩ්ඪා යථාබුඩ්ඪං-අධිකිච්ච පවත්තානකානි අජ්ඣත්තං-අධිකිච්චපවත්තො අජ්ඣත්තානනානි අජ්ඣත්තං-මේ නයින් සෙසු සූවිසද දතමනායි.

සමාසයනෙම සංඥාවසයෙන් මනමය බහුව්‍රීහිය තත්පුරුෂය කර්මධාරය ද්විගු අව්‍යයීභාවය යි සවැදෑරුම් වේ.

පාණිනීය ව්‍යාකරණයෙහිවූ කලී අව්‍යයීභාව තත්පුරුෂ බහුව්‍රීහි ද්වන්ද්වයයි සිවුවැදෑරුම් කර්මධාරය ද්විගු යන දෙදෙනා තත්පුරුෂයෙහිම අන්තර්ගත කෙරෙති "සමාසශ්චතුර්විධ ඉති ප්‍රායොවාදඃ" අව්‍යයීභාව තත්පුරුෂ බහුව්‍රීහි ද්වන්ද්වාධිකාර වහිර්භූතානාමපි "සහ සුපෙති" විධානාත් — පූර්වපදාර්ථප්‍රධානොව්‍යයීභාවඃ, උත්තර පදාර්ථප්‍රධානස් තත්පුරුෂඃ, අන්‍යපදාර්ථප්‍රධානො බහුව්‍රීහිඃ, උභයපදාර්ථ ප්‍රධා

නො මතවත්‍රතෑපි ද්‍රාවිං ප්‍රවාදඃ ප්‍රාගෛ්‍යනිප්‍රායඃ, සූපප්‍රති-උන්මත්තගඞ්ගං. ඉත්‍යාදෞ අව්‍යයීභාවෙ, අතිමාලාදෞ තත්පුරුෂෙ, චිත්‍රගුප්තාදි බහුව්‍රීහෞ, දනෙතාෂ්ඨිතාදි චගෙව චාභාවාත්; තත්පුරුෂ විශෙෂඃ කර්මධාරයඃ සර්වශෙෂො ද්විගුඃ —— අනෙක පදත්වං චනවිබහුව්‍රීහෙනග්‍රව තත්පුරුෂස්‍ය ස්වවිශෙදවෙතන්‍යකඃ, කිංච.

"සුපාං සුපා තිඩා නාම්නා ධාතුනාථ තිඩාංතිඩා
සුබනෙතනෙති විඥෙයඃ සමාසඃ ෂඩ්විධො බුධෛඃ"

සුපාංසුපා, රාජපුරුෂඃ; තිඩා, පර්‍යභූෂයත්; නාම්නා, කුම්භකාරඃ: ධාතුනා, කටප්‍රූඃ-අජස්‍රම්; තිඩාංතිඩා, පිවත ඛාදතා; ඛාදත මොදතා; තිඩාංසුපා, කෘන්තවිචක්‍ෂණා; එවමාදි ආචාර්‍ය්‍යභටොජිදීක්ෂිතයන් විසිනි.

සමාසය සිවුවැදෑරුම් යනු බාහුල්‍යෙනපචාරවාදයි අව්‍යයීභාවය තත්පුරුෂය බහුව්‍රීහිය චනවය යන මේ සමාසයන් ප්‍රධානත්‍වය මෙයින් බැහැරවූද සමාසයන්ගේ "සහ සුපා" යනාදීන් විධානකරණහෙයිනි, අව්‍යයීභාවය පූර්වපදාර්ථප්‍රධානය තත්පුරුෂය උත්තරපදාර්ථප්‍රධානය බහුව්‍රීහිය අන්‍යපදාර්ථ ප්‍රධානය චනවය උභය පදාර්ථප්‍රධානය යනමෙය පුරාණ ආචාර්‍ය්‍යන්ගේ භූයොවෘත්ති අභිප්‍රායයි කවර හෙයින්ද සූපප්‍රති උන්මත්තගඞ්ගං, යනාදිය අව්‍යයීභාවයෙහි පූර්වපදාර්ථප්‍රධානව නොපෙනෙන හෙයිනි. එසේම අතිමාලඃ, යනාදිවූ තත්පුරුෂයෙහි උත්තර පදාර්ථ ප්‍රධානතාව අන්‍යපදාර්ථප්‍රධානව පෙනෙයි- චිත්‍රාඃ යනාදිවූ බහුව්‍රීහියෙහි අන්‍යපදාර්ථ ප්‍රධානබැව්නැත්- දනෙතාෂ්ඨං, යනාදී චනවයෙහි උභයපදාර්ථප්‍රධාන් බැව් නැත්; එසේ හෙයින් ප්‍රායොවාද යයි දත යුතු—කර්මධාරය තෙමේ තත්පුරුෂ විශෙෂයකි- ද්විගු සමාසය එම කර්මධාරය විශෙෂයකි—බහුපද භාවය හෝ පද දෙකකට වැඩි බව චනම බහුව්‍රීහි දෙක්හිමැයි කිසිතැනක තත්පුරුෂයෙහිත් බහු පදත්වය වන්නේයයි කියනලදී.

තවද, බුධයෙ, නුවනැත්තන් විසින් ෂඩ්විධඃ සමාසඃ, සවැදෑරුම් සමාසය; විඥෙයඃ, දතයුතුයි; එනම්-සුපාං සු

පා, නාම විභත්‍යන්තපදයක් නාමයනා සමාසවෙයි, රාඥඃ පුරුෂඃ=රාජපුරුෂඃ; තිඩා, නාමපදය ක්‍රියාපදය කැටිවත් සමාසවෙයි, "පර්‍ය්‍යභූෂයත්" යනුමෙනි; පරි යන උපසර්ගය නාම සඞ්ඛ්‍යායි "අභූෂයත්" ක්‍රියායි; නාමිනා, නාමපදය කෘදන්තය කැටිවත් සමාසවෙයි කුම්භං කරෝතීති කුම්භකාරඃ; ධාතුනා, නාමපදය ධාතුවකැටිවත් සමාසවෙයි, කටප්‍රූඃ-අජස්‍රම්, යනුමෙනි; තිඩාංතිඩා, ක්‍රියාපදය ක්‍රියාපදය කැටිවත් සමාසවෙයි, "පිවත ඛාදතා; ඛාදත මොදතා" යනුමෙනි; සුබන්තෙන, ක්‍රියාපදය නාම පදය සමගද සමාසවන බැව්පෙනෙයි, "කෘන්ත විචක්ෂණා" යනුමෙනි; මේආදිවිශෙෂ විභාග බොහෝයි ග්‍රන්ථබාහුල්‍ය භීතින් උපෙක්ෂාවිමු.

ඉති සමාසකණ්ඩො සමත්තො.

---

15 කච්චාදිතො පි එකම්හා සද්දතො නියමං විනා
අනෙකත්ථෙ සති හොන්තෙව සබ්බෙ තද්ධිතපච්චයා

සබ්බෙතද්ධිතපච්චයා, සියලු තද්ධිතප්‍රත්‍යයෝ; අනෙකත්ථෙ සති, නානාර්ථඇතිකල; නියමංවිනා, අනියමයෙන්; කච්චාදිතො, කච්චාදි ශබ්දගණයන්හි; එකම්හාඅපි සද්දතො, එක ම ශබ්දයකිනුත්; හොන්තිඑව, වෙත්මය.

"ණායන ණාන වච්ඡාදිතො" යනාදි සූත්‍රරින් මේමේ ප්‍රත්‍යය මේ මේ ශබ්දගණයෙන් වේයයි නියමිතයි යම්ප්‍රත්‍යයෙක් කච්ච වච්ඡාදින්ගේ පූර්වමනුෂ්‍යාදි එක් එක් අර්ථයක් තමාවාචක බැවින්ද තව්‍යවහාර බාහුල්‍යයෙන්ද කරණලදී ශබ්දයන් තමන් නානාර්ථ බැවින් ඒනියමය හැර කච්ච වච්ඡාදි ශබ්දයන්ගේ අනෙකාර්ථ වාචකබැව් ඇතිකල්හි කච්චාදි එකශබ්දයකිනුත් සකල ප්‍රත්‍යයෝම වෙත්යයි මේ ආචාරීන්ගේ මතයයි,

තද්ධිතය, සාමඤ්ඤය අව්‍යය භාවයයි ත්‍රිභේදයි, එහෙයින් කච්චායන භෙදයෙහි

"සාමඤ්ඤභාවබ්‍යයභාවෙන තද්ධිතං තිවිධං භවෙ" යි

සාමඤ්ඤතද්ධිතයෙහි - ණ, ණායන, ණාන, යනාදි ප්‍රත්‍යයෝ සතළිස් සයක්වෙති

අව්‍යය තද්ධිතයෙහි, ථා, ථත්තා, ථං යනාදී අටවිස්සක් වෙති. භාවයෙහි, ණ්‍ය, ත්ත, තා, යනාදී එකොළොස් වෙති මෙහි විස්තරය කච්චායන භෙදයෙන් දතයුතු

මෙඇර අන්‍යාවාසීර්වරයෝද තද්ධිත විභාගය දක්වත් තෝ සාමාන්‍ය තද්ධිතයෙහි කියනලද වන්තු මන්තු ආදීන් ගේ විශෙෂ ප්‍රකාශකරමින් මේ කියති

"භූම නින්‍දා ප්‍රශංසා ශු නිත්‍යයොගෙ තිසායනෙ
සංසග්ගෙ සන්නිච්චක්ඛායා මතී මත්වාදයොමතාඃ"

භූම, බාහුල්‍යයෙහි "ගොමාන්පුරුෂඃ" බොහෝ ගවයන් ඇති පුරුෂයායි, නින්‍දා, ගර්හයෙහි "පාපිපුරුෂඃ" පාපබහුල පුරුෂයායි; ප්‍රශංසාශු, ප්‍රශංසායෙහි; "රූපවාන්පුරුෂඃ" රූවත්පුරුෂයායි, නිත්‍යයොගෙ, නිත්‍යසම්බන්ධයෙහි, "ක්ෂීරිනොවෘක්ෂාඃ" කිරිඇති වෘක්ෂයෝයි, අතිශායොගෙ, අතිශයාර්ථයෙහි "උදරවතිකන්‍යා" බඩමහත් කිඩියයි, සංසග්ගෙ, සංසර්ගයෙහි, "දණ්ඩිපාළඃ" දඬුසහිතමකියායි, අස්තිච්චක්ඛායං, අස්ත්‍යර්ථිච්ඡාකායෙහිලා, මත්වාදයඃඅපි, මතුබාදී මේ ප්‍රත්‍යයෝ, මතාඃ, දන්නාලද්දූහ.

මේ ආදී විශෙෂවිභාග බොහෝයි භෙදතත්තවව්‍යාකරණයෙන් දතමනායි මෙහියෙදුවහොත් ග්‍රන්ථවිශාලවෙයි එහෙයින් නොලිමු.

ඉති තද්ධිතකප්පො සමත්තො

---

16 කත්තරි ත්‍යාදයො කම්මෙ තථා භාවෙතු මෙරයා
සබ්බෙ තෙ පචධාතුම්හි සඛෙපෙන මරූමයා

කත්තරි, කර්තෘකාරකයෙහි; ත්‍යාදයො, ද්‍රොග සත් සිංහයෝකි; කම්ම, කර්මකාරකයෙහිද; තථා, එසේම සත් සියයෙකි; භාවෙතු, භාවයෙහි වනාහි; මෙරයා, එක්සිය පස් විසෙකි; පචධාතුම්හි, පච පාකෙ යන ධාතුයෙහි; තෙ සබ්බෙ, ඒ ප්‍රයොගසියල්ලෝ; සඛෙපෙන, සංක්ෂෙපයෙන් හෝ එක්කිරීමෙන්; මරූමයා, එක්දහස් පන්සිය පස් විසෙකි.

කර්තෘයෙහි කරණලද්දාවූ විභක්ති ප්‍රත්‍යයෙන් ගණනාලද පචධාතු ප්‍රයෝගයෝ සත්සියයෙක්වෙති ඒ මෙසේයි වර්තමානාදී අටවිබයෙකි; එහි, වර්තමානාම, පූර්වෂට්කය

අපර තවිකායයි කියනලද පරස්මෛපද ආත්මනෙපද වශයෙ
න් දෙළොසකි එසේම පංචමියෙහි දෙළොස ආණත්ති ආශිංස
න අර්ථවශයෙන් විගුණ කළෝ සූවිස්සකි සප්තමියෙහි
දෙළොසද අනුමති පරිකප්පය යි යන අර්ථදෙකින් සූවිස්ස
ක් වැයි පරෝක්ඛා හිය්‍යත්තනී අජ්ජතනී භවිස්සන්ති කාලාති
පත්ති යන පස්සෙහි දෙළොස බැගින් එක්කළෝ සමසැටෙක්
වෙති; පච වචාති යනාදී ති ලොපාදියෙන්ද "එය්‍යුස්සඋං
ඉංසු" ආදී ආදෙශයෙන්ද අපචි පචි ආදී භූතවශයෙන්ද නැව
ත විස්සක් එක්කළාහු එක්සිය සතළිසකි කෙවල ධාතූ කා
රිත ප්‍රත්‍යයෝ සතරදෙනායයි පස්ගුණකළෝ සත්සියයෙකි
කර්මයෙහි කළ විභත්ති ප්‍රත්‍යයෙන් ගණනාලද ප්‍රයොග
යෝ එසේම සත්සියයෙකි හෙවත් "භාවකම්මසුයො" යි
යප්‍රත්‍යයෙන්ද කාරිත ප්‍රත්‍ය චතුෂ්කයෙන්ද යන පසින් ගුණ
කරණලද්දාහුයි.

භාවයෙහි කරණලද ප්‍රයොගයෝ එක්සිය පස් විස්සකි
එනම් කර්මයෙහි කීණුක්‍රමයෙන්ම එක්සිය සාළිස ගෙණ ව
ර්තමානයෙහි "අන්තෙ" වචනයට රෙයනාදෙසණ නොවී
මෙන් එකක්ද පංචමියෙහි "හි" ලොප්නොවීමෙන් දෙකක්ද
සප්තමියෙහි "එකාර" දෙශනොවීමෙන් අටක්ද අජ්ජතනි
යෙහි "ඉත්ථ ඉංසු" ආදෙශනොවීමෙන් තුනක්ද කාලාතිප
ත්තියෙහි "භූතව" නොවීමෙන් එකක්දැයි යන පසළොස
හළ කල එක්සිය පස්විස්සකි * මේ සියල්ල සම්පිණ්ඩනය
කළ් පචපාකෙ යනධාතුවෙහි සකල ප්‍රයොගයෝ එක්දහ
ස් පන්සිය පස් විස්සක් වෙති.

---

* මේ ආචාර්‍ය්‍යන් විසින් දක්වනලද භාවය පුරුෂත්‍රයෙ
හින් ඒකවචන බහු වචන දෙක්හින් පෙණෙන්නා අන්‍ය
වෛයාකරණයන්විසින් උපදිෂ්ට මාගධ සංස්කෘත දෙක්හි
ම ආත්මනෙපද ප්‍රථම පුරුෂ එකවචනයෙහි පමණකි මාගධී
ක්‍රමයෙහි ආත්මනෙපදට පරස්මෛ පදාදෙසයෙන් පර
ස්මෛපදරූපද පැණෙත් ඒමෙසේයි හි අභාති ආදී දෙ,
ළොස් විබත්තිම "භූයංත" යි ගෙණ භූනති කියා නැවත
පරස්මෛ පදාදෙසයෙන් දෙකකි-සංස්කෘතයෙහි "භූය
තෙ" වර්තමාන අටළොස් විබත්තින්මඑකක්මැයි-මේ භාව
ප්‍රයොග එක්සියපස්විස්ස ශබ්දබිඳුකර්තෘආචාරීන්ගේ සහ
එහිටීකාතැතු ආචාරීන්ගේත් මතිමාත්‍රයි.

17 ගමිම්හි තිගුණා එතෙ සම්භවා අඤ්ඤධාතුසු
අනන්තාව පයොගා තෙ ආදෙසපච්චයාදිහි

ගමිම්හි, ගමුගතිම්හි යන ධාතුවෙහි; එතෙ, මෙසින් හෙවත් මේ පච ධාතුවෙහි ප්‍රයොග එක්දහස් පන්සිය පස් විස්ස; තිගුණා, තුන්ගුණවූවෝ වෙති; අඤ්ඤධාතුසු, අන්‍ය ධාතූන්හි, සම්භවා, යථා සම්භවයෙන් හෙවත් ලැබුන පරිද්දෙන්මෙන්; තෙපයොගා, ඒ ප්‍රයොගයෝ; ආදෙසපච්චයා දිහි, ආදෙශප්‍රත්‍යාදීන් කරණකොට ගෙණ; අනන්තාව, කෙළවර නැත්තෝමය.

පච පාකෙ යන ධාතුවෙහි එක්දහස් පන්සිය පස්විසි ප්‍රයොගයන් ''ගම්මති'' ''ගච්ඡති'' ''ඝම්මති'' යනාදී අනාදෙශ ආදෙශ වසයෙන් තුන්ගුණ කළකල්හි ගමු යන ධාතුවෙහි සාරදහස් පන්සිය පන්සැත්තෑවක් ප්‍රයෝගවෙති.

භූ, හූ, තිජ, ගුප, යනාදී අන්‍යධාතූන්හි අනාදෙශාදෙශ විකරණ ප්‍රත්‍යය සකර්මක අකර්මකාදි වසයෙන් සමානාධි කරණ ප්‍රයොගයෝ යෙදිය යුත්තාහ; ඔව්හු ආදෙශ ප්‍රත්‍යයාදීන් කරණකොටගෙණ අසංඛ්‍යයටයෙති.

ඉති ආඛ්‍යාත කප්පො සමත්තො

---

18 කිතාදි පච්චයා සබ්බෙ එකම්හා අපි ධාතුතො
සියුං නුරූපතො සන්තසාධනෙ සති පායසො

සබ්බෙකිතාදිපච්චයා, කිත්ආදි සකලප්‍රත්‍යයෝ; එකම්හා අපිධාතුතො, එකධාතුවකිනුත්; සන්තසාධනෙසති, සාධන සත්‍යැතිකල්හි; පායසො, භූයොවෘත්තියෙන්, අනුරූපතො සියුං, සුදුසු පරිද්දෙන් වෙත්.

කිච්චය කිතක යයි කියා සකල ප්‍රත්‍යයෝම දෙවැදෑරුම් වෙත්, කිච්චයෝනම් තබ්බ අනීය ණ්‍ය රිච්ච යනමොහුයි; කිත්නම් ''ණ්වදයොතෙකාලිකා'' යන්නෙන් නියමකරණලද ණ්වුප්‍රත්‍යය ආදිකොටඇති ''නන්දාදිහියු'' යන්නෙන්වන යු ප්‍රත්‍යය අන්තකොට ඇත්තාහුයි; ණ්වු ප්‍රත්‍යය තුප්‍රත්‍යයාදීහු

කර්තෘවිෂයෙහි කිත්නම්වෙත්; තබ්බප්‍රත්‍යයාදීහු භාව කර්ම විෂයෙහි කිච්චයෝ නම් වෙත්. ණ්‍යු ප්‍රත්‍යය ණ්‍ය ප්‍රත්‍යයාදීහු කර්තෘකර්මාදි විෂයෙහි කිතකිච්චයෝ නම්වෙත්; මේ කිතාදි සකල ප්‍රත්‍යයෝ කර කරණෙ යනාදි එක් ධාතුවක්හුගේ සම්බන්ධයෙහින් කර්ම කර්තෘ කරණ සම්ප්‍රදාන අපාදාන ඔකාස යන ෂට්කාරකය හා භාවය හැඟෙනකල්හි ධාත්වර්ථයට සුදුසු පරිද්දෙන් වෙති; කර ධාතුව කෙරෙන් වූනාහි "සඤ්ඤායං දධාතොඉ-ජිතො ඉත්‍යෙබ්බත්" යනාදි සූත්‍රරින් නියමකරණලද ඉ ඉත ආදි කිසි ප්‍රත්‍යයක් හැර නියම නොකරණලද සකල ප්‍රත්‍යයෝ සුදුසුපරිද්දෙන් වෙත්; ආවි ප්‍රත්‍යයාදීහු නොවෙත්; ඒමෙසේයි.

කිච්චයෝ පළමුකොට දක්වනුලැබෙත්; කර කරණෙ යන ධාතුව කෙරෙන් තබ්බප්‍රත්‍යය කළකල්හි, කරීයතෙති කත්තබ්බං භවතා, කත්තබ්බො ධම්මො, කත්තබ්බා දූත අනීය ප්‍රත්‍යය; කරණීයං භවතා, කරණීයො කරණීයා; ණ්‍යප්‍රත්‍යය, කාරියං භවතා, කාරියො, කාරියා; රිච්චප්‍රත්‍යය, කත්තබ්බං, කිච්චං.

කිත්හු; ණප්‍රත්‍යය, කුම්භං කරොතීති කුම්භකාරො; අප්‍රත්‍යය, දීපඞ්කරොතීති දීපඞ්කරො, සුඛදුක්ඛමෙතවා කරියතෙති සුකරං, කම්මං-කිරියාව කරෙතීති එතෙනාති කරො, හත්ථො, ආකිරියති එතස්මා එස්වාති ආකරො උප්පත්තිඨානං; ණ්වු ප්‍රත්‍යය, කරොතීති කාරකො—තුප්‍රත්‍යය, කරොතීති කත්තා, කාරාපෙතීති කාරාපෙතා-කම්ප්‍රත්‍යය, භඤ්ජන කරොතීති භාණ්ඩකො-රම්මප්‍රත්‍යය, කරීයත්තීති කම්මං—රිදුප්‍රත්‍යය, පාපං කරෙතී සීලෙනාති පාපකාරී-රූප්‍රත්‍යය, කරොතී සීලෙනාති කාරූ; * යු ප්‍රත්‍යය, කරීයතෙ කත්තබ්බං වා කර

---

* "කෘවාපාජිමිස්වදිසාධ්‍ය ශුභ්‍යභ්‍ය උණ්" කෘ වා පා ජි මි ස්වද් සාධ අශූ මේ අෂ්ටධාතූන්කෙරෙන් පරව උණ්ප්‍රත්‍යය වෙයි; කරොතීති, කාරූ "දූසිබොසෞඥියාශබ්දෘ ශිල්පි නෘපිව වර්ණ්‍යතෙ" මේ ආදී ක්‍රමයෙන්– ආචාර්‍ය්‍ය උජ්ජ්වල දත්තයන් විසින් දක්වනලදී මෙහි කාරූශබ්දය උණ්ප්‍රත්‍යයෙන්සිද්ධයි.

ණං, කරෝතීති කරණං, කරෝති එතෙනාති කරණං අධි
කරීයති එත්ථාති අධිකරණං - ත්‍යු ප්‍රත්‍යය, පකරණං පකති-
රිරියප්‍රත්‍යය, කත්තබ්බා, කිරියා, කරණීයං, කිරියං–ත තව
න්තු තාවීප්‍රත්‍යයයින්; අකාසීති, කතො, කතවා, කතාවී - තප්‍ර
ත්‍යය, කත්තබ්බං, කතං, පබ්බයෙහි සංගාමං කරීයතෙති,
සංඛතො, ප ආකරෙති, පාකටො, දුකතො–ඛප්‍රත්‍යය, දු
ක්ඛෙන කරීයත්ති දුක්කරං හිතං භවතා; සුකරං පාපං
බාලෙන-තුං ප්‍රත්‍යයාදිය පුණ්‍යානි කාතුමිච්ඡති, පුණ්‍යන්
කාතමෙ ඉච්ඡති, කාතුම්ච්ඡති, කත්තුන, කත්වාන, කරිවා–
මාන, න්ත, ප්‍රත්‍යයන්, කරමානො, කුරුමානො, කරීයමා
නො, කරොන්තො කුබ්බන්තො, කාරෙන්තො, කාරය
න්තො, කාරාපෙන්තො, කාරාපයන්තො; ණිණ ප්‍රත්‍යයාදිය,
ආයතිං කරණං සීලං අස්සාති, කාරී, කම්මං, කරිස්සං වජති,
කාරකො වජති, කත්තුං වජති, කත්තා වජති, කම්මංකරි
ස්සං වජති කම්මං කරොන්තො වජති, කම්මං කුරුමානො
වජති, කම්මංකරණො, වජති, අකාසි කරොති කරිස්සතීති
කාරු=සිල්පී, කම්පනං කරොතීති කරුණා, කාරිසිමෙ ක
ම්මං අවස්සං, කාරණං කුණාති තෙන නිබ්බානං, කුණාතිමං–
මේ නයින් අනංධාතුන්හිද යෙදිය යුතුයි.

### ඉති කිත කප්පො සමත්තො

---

19 ඉමිනා කිච්ලෙසෙන සක්කා ඤාතුං ජිනාගමෙ.
පයොගා ඤාණිනා සින්ධුරසොවෙකෙන බින්දුනා

ඤාණිනා, නුවනැත්තනු විසින්; කිච්ලෙසෙන ඉමිනා, අ
ල්ප්‍රපදෙශවුමෙයින්; ජිනාගමෙ, ත්‍රිපිටක බුද්ධවචනයෙහි;
පයොගා, ප්‍රයොගයෝ; එකෙන බින්දුනා, එක් බොඳෙකින්;
සින්ධුරසො ඉව, සාගර ජලරසයසේ; ඤාතුං, දන්නට, ස
ක්කා, හැකිවනුලැබෙති.

20 රම්මං සිඤපපවෙසාය පුරං පිටකසඤ්ඤිතං
මග්ගොහාජු මග්ගතා මග්ගං සද්දං රණෙන්ද විසොධිතා

පිටක සඤ්ඤිතං, පිටකයහෝ ත්‍රිපිටකයයි නම්ලද. රම්මං.
පුරං, රම්‍යවූ නිවුරයට; සිඤපපවෙසාය; වහා වදනා. පිණිස;

සද්දරත්නොපදා, ශබ්දරත්නයෙනි [ශබ්දශාස්ත්‍ර නමැතිමෙනො-
හි] මග්ගං මග්ගනං, මාර්ගය ගවෙසනයකරන්නන්ට, උප්
මයොගා, සෘජුවූමාර්ගයතෙම; විසොධිතො, පහසනලද්දේය
[හෙවත්] සුධකරණ ලද්දේය.

මේ සඳහා ටීකාවෙහි

සිද්ධිකාමචරිය භූමිභෙදකාචරියෙහි සුමාපිතං තීහි සඞ්ගීතිප
ර්ඛාහිචෙව අක්ඛරපදබ්‍යඤ්ජනානං පාකාරෙහිච පරික්ඛිත්තං,
සංවණ්ණනාද්වාරගොපුරොපසොභිතං, නානානය මග්ගවීථී
හි සුවිභත්තං, විනයාරාමරමණීයතරාමපොක්ඛරණීහි චෙව සු
ත්තන්ත සභාසාලාසන්නිපාතාගාරෙහි ච අභිධම්ම පාසාද කූටාගාර
සරෙහි ච සමලඞ්කතං, ආභිධම්මික විනයධර සුත්තන්තික
ඛත්තිය බ්‍රාහ්මණ ගහපතිකෙහි නිවසිතං, * සද්දසත්ථී
[සත්ථි] කෙහි සුරක්ඛිතං, ආභිධම්මික පුරොහිතෙහිචෙව වින
යධර විනිච්ඡයක මහාමත්තෙහි ච සුත්තන්තික සෙනාප
තීහි ච සුවිචරිතං, නානාකුලා පබ්බජිතෙහි නානාවෙර
ජ්ජකෙහි උග්ඝටිතඤ්ඤූආදිවසෙන සමාකිණ්ණං, වාචනුග්ගහණ
සජ්ඣායන සද්දෙහි අවිවිත්තං, දෙසනානුසාසනසද්දෙහි සඞ්ඝු
ට්ඨං, සීලාදිවිවිධපටිපත්තිඅලඞ්කාරවිවිධරතනොපභොගපරි
භොග සම්පන්නං, පදබ්‍යඤ්ජනපරමභොජනපාන සංයුත්තං, සද්
ධම්මරාජවරචක්කවත්තිනො සුරම්මපිටකමහානගරං පවිසිත්වා
රමිතුං ගන්තබ්බං මග්ගං, ගවෙසනකානං කුලපුත්තානං
අක්ඛරපදලිඞ්ගවිභත්තිසන්ධිසමාසධාතුපච්චය සා දෙ සා ග ම
ලොපාදි කච්චායන කණ්ටකගහණාදිජපිතෙ විජ්ජානන්තරවා
දනන්තරාදි බාහුදකච්ඡනතටාකකන්දරාදි දුග්ගසඞ්ගෙ X
අනෙකරාමගෙහ සද්දසත්ථමහාරඤ්ඤෙ උප්පථගතභූතො අසං
සද්දවිඤ්ඤුගන්ථමග්ගො විසොධිතො, සමංකතො යොච පිට
කු සබ්බාතසුරම්මං මහාපුරං පවිසිතු කාමො ඉමං සද්දවිඤ්ඤු
ගන්ථමග්ගං පටිපජ්ජතු ති.

---

* නිවුත්ථං

X ලොපාදි ජපිතෙ විජ්ජානන්තර වාදනන්තරාදි දුග්ගසඞ්
ගෙ සද්දවිඤ්ඤුසම්බාධෙ කච්චගුම්බකණ්ටකගහණාදි ජපිතෙ;
බාහුද කච්ඡනතටාක කන්දරාදි දුග්ගසඞ්ගෙ.

## මෙහි භාවය

සඞ්ගීති කාරක මහාස්ථවිර නමැති බිම්ගඳුනන නුවර වඩු ඇදුරන් විසින් යෙහෙන් නිමනලද්දාවූ, තුන්සඞ්ගීතිනමැතිපිරි පිරියෙන්හා අක්ෂර පදබ්‍යඤ්ජන පවුරෙන්ද සංවර්ණනා නමැති මාර්ග තෝරණයෙන් හො බවන ලද්දාවූ නානාක්‍රමනමැති මාර්ගවීථියෙන් මොනවට බෙදනලද්දාවූ විනයාදි ශාසනා නමැති රමණීය අරම්හා පොකුණින්ද සූත්‍රාන්තනමැති සභාගෘහසහිත මන්ත්‍රණාගාරයෙන්ද අභිධර්ම නමැති පහකුළු ගෙවල් රැසින්ද මොනවට අලඞ්කෘතකරණලද්දාවූ විජම්ද ත්විනෙදැරි සුතුරු හදුරන්නන් නමැති කැත් බමුණු ගොවීන් විසින් වාසග්‍රහණය කළාවූ, ශබ්දශාස්ත්‍ර නමැති අවිගත්තන් විසින් යෙහෙන් අරකුන් ගන්නාලද්දාවූ, අබිදම් හදුරන්නන් නමැති පෙරවියන් විසින්ද විනෙදැරි නමැති දම් අදිකරණමග ඇමතියන් විසින්ද සුතුරු හදුරන්නන් නමැති සෙන්ගොවුවන් විසින්ද යෙහෙන් හැසිරෙණ ලද්දාවූ නන් කුශලෙන් පැවිදිවූවන් නමැති නත්රජයෙන් පැමිනිය වූන් විසින් ඉගැණීම් ආදී වසයෙන් වනාකුලවූ කියවීම් ඉගැණීම් හැදෑරීම් ශබ්දයෙන් අතරක් නැත්තාවූ දෙසුම් නමැති මගුල් කෙළි හඬින් උද්ඝොෂිතවූ සීලාදි නානාර්ථ නානාලඞ්කාර නමැති විවිධ රතන උපභොග පරිභොගයෙන් හොබනාවූ අර්ථව්‍යඤ්ජන නමැති පරමාහාරපානඇති සදහම්රජ නමැති ප්‍රශස්ත සක්විති රජහුගේ අතිශයකමණීය තුන් පිටක නමැති මහනුවරට වැද සිත්අලවා වාසයට යාහුතු මග පිරියෙස්නාවූ කුලදරුවන්ට(ශාසනා වචරයන්ට)අකුරු පද ලිඟු විබත් සමස් දා පස අදෙස් අගම් ලොප් ආදිවූ කසඹ * ගුල්ම කටු ලැගැප් ආදියෙන් වියවුල්වූ නානා විධි නානාවාදදි නමැති පුෂ්කරණී හා නිති දියඇති තලාක කඳුරැලි ආදිවූ දුර්ගමස්ථානයෙන් යුක්ත අතුරුමග ඇති ශබ්දශාස්ත්‍ර නමැති මහවෙනෙහි ඍජුමාර්ග සඞ්ඛ්‍යාත මේ ශබ්දබින්දු ග්‍රන්ථනමැති මාර්ගය සුධකරණලද්දේය—තවද යමෙක් ත්‍රිපිටක සංඛ්‍යාත සිත්කළු මහනුවරට වදනා කැමැත්තේනම් මේ ශබ්දබින්දු ග්‍රන්ථමාර්ගයට පිළිපදිවා යනුයි

---

* ලොප් ආදිවූ කියයුතු දෑ නමැති ගුල්පාදියෙන් ගෝ අ.ජීයි.

21 තෙනෙව කිඤ්චි ජලිතොජ්ජලිතො පදීපො ×
කච්චායනුත්ති රතනොචිත ගබ්භකොණෙ
ධම්මාධිරාජගරුණා ගරුමාමකෙන
ධම්මෙන යොධිපතිනා සගරූපහිතො

සො, සමෙක් තෙම; උද්ධිපතිනා, උද්වීස්වාමීහු විසින්; හෙවත් රජහු විසින්; ධම්මෙන, දහම් කරණකොටගෙණ ගරුමාමකෙන, මාගේ ගුරුයයි ඇන බුහුමනින් යුක්තා; සගරූපහිතො, ස්වකීය ගුරුවාටට පමුනුවන ලද්දේනම්; ධම්මාධිරාජගරුණා, ධර්මරාජ ගුරුනම්වූ; තෙනෙව, උන්ම හන්සේ විසින්ම; පදීපො, ප්‍රදීපයක්බඳු [මේ ශබ්දබින්දුග්‍රන්ථය] කච්චායනනුභාගී රතනොචිතගබ්භකොණෙ, [illegible] නොකති රුවන්රැස්කල ගබඩාකොණ්හි; කිඤ්චිජලිත, මඳ කොට ප්‍රකාශකිරීමෙන්; උජ්ජලිතො, උත්කෘෂ්ටයෙන් දල්වන ලද්දේය,

ඉති සද්දබින්දුපකරණං සමත්තං

---

× ජලිතො ජලිතො - යී ඇතම්.

## ලිඞ්ගත්‍රයෙහි කියනලද ශබ්දප්‍රයෝග හසියනැට

පුම්ශබ්දයෙහි ප්‍රයෝග තෙවිස්සය අනු "ආස්" යනාදෙශ යෙන් නිපන් බුඩාය යන චතුර්ථී එකවචනය හැරයී. *

### පුම ශබ්දය

| | එකවචන | බහුවචන |
|---|---|---|
| පඨමා - | පුමා, | පුමානො |
| ආලපන - | පුමං, | පුමානො × |
| දුතියා - | පුමං, | පුමානො |
| තතියා-කරණ - | පුමානා, පුමුනා, පුමෙන, | පුමානෙහි, පුමානෙභි, |
| චතුත්ථී - | පුමුනො, පුමස්ස, | පුමානං |
| පඤ්චමී - | පුමුනා, | පුමානෙහි, පුමානෙභි, |
| ඡට්ඨී - | පුමුනො, පුමස්ස, | පුමානං, |
| සත්තමී - | පුමානෙ, පුමෙ, පුමම්හි, පුමස්මිං, | පුමාසු, පුමෙසු, † |

* මහාශබ්දනීතියෙහි-අකාරාන්තශබ්දයන්ගෙන් පරවූ චතුර්ථී එකවචන ස විභක්තියට ආය යනාදෙශය- අපෙපාස්ස ගමාය ගච්ඡති- දක්ඛිණෙති-විරමථායස්මා මම වචනාය- අප්පොස්සුක්කාය-සම්බොධාය-නිබ්බාණාය-සංවත්තති යනාදි ගත්‍යර්ථකර්ම, නයනාර්ථකර්ම, විභක්තිවිපරිනාම, තදර්ථ, යනමේ සිවු තන්හිමුත් දානාරෙචනධාරණ නමොයොගාදී සම්ප්‍රදාන විෂයවූ පෙළෙහිද පුරාණ අටුවාහිද නැතැයි දක්වත්.

× ආලපනකියා ප්‍රකටයේ උක්තබැවින් ආලපන හෙබවන හෙ, භො, රූපයන් නොදැක්වීමු.

† මහාශබ්දනීතියෙහි- ප-ආ-දෙක්හි—පුමායි බුහුබසක්ද මෙහි කී පුමං යන්නහැර පුම යන්නක්ද; දු-පුමානං, පුමානෙ, සී ම්ටවිපරීතවද, ත-මෙහි දැක්වූ පුමුනා, පුමෙන, යනුහැරද- පං- පුමුනාහැර පුමානාකියාද-ස-පුමෙ, පුමම්හි, පුමස්මිං යන රූපත්‍රය නොපෙණෙයි. පුමාසු, පුමෙසු, යන බහුවචනහැර පුමානෙසු යන්නක්ද දක්වත්.

## යුව ශබ්දය

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප– | යුවා, | යුවානො, යුවානා |
| ආ– | යුව, යුවා, යුවාන, යුවානා, | යුවානො, වානො, |
| දු– | යුවානං, යුවං, | යුවානෙ, යුවෙ |
| ත-ක– | යුවානා, යුවෙන, | යුවානෙහි, යුවානෙභි, යුවෙහි, යුවෙභි, |
| ච– | යුවානස්ස, යුවස්ස, | යුවානානං, යුවානං |
| පං– | යුවානා, යුවානස්මා, යුවානම්හා, | යුවානෙහි, යුවානෙභි, යුවෙහි, යුවෙභි, |
| ඡ– | යුවානස්ස, යුවස්ස, | යුවානානං, යුවානං |
| ස– | යුවානෙ, යුවානස්මිං, යුවානම්හි, යුවෙ, යුවම්හි, යුවස්මිං | යුවානෙසු, යුවාසු, යුවෙසු × |

මෙහි දෙවිසස්ස යනු "හි විභත්තිම්හිච" යන්නෙහි ච ශබ්දයෙන්ද "අකම්මන්තස්සච" යන්නෙහි ච ශබ්දයෙන්දවූ ආන ආ යනාදෙශයන්ගෙන් සිද්ධවූ පද පමනක් සලකායි නොහොත් පුමශබ්දයට වෙනස් පදයන් සලකායි.

## සන්ත ශබ්දය

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප– | [එසො] සං, සන්තො, | [එතෙ] සන්තො, සන්තා |
| ආ– | සං, සන්ත, සන්තා, | සන්තො, සන්තා |
| දු– | සතං, සන්තං, | සන්තෙ |
| ත-ක– | සතා, සන්තෙන, | සබ්භි, සන්තෙහි, සන්තෙභි |
| ච– | සතො, සන්තස්ස, | සතං, සන්තානං |
| පං– | සතා, සන්තස්මා, සන්තම්හා, | සබ්භි, සන්තෙහි, සන්තෙභි |
| ඡ– | සතො, සන්තස්ස, | සතං, සන්තානං |
| ස– | සති, සන්තෙ, සන්තම්හි, සන්තස්මිං, | සන්තෙසු, § |

× ප, බ-යුවා–දු, බ-යුවානෙ-ත, එ-යුවානෙන-ස, බ-යුවසු-ආ-(හෙ) යුවාන (භවන්තො) යුවානා-යි මහාසද්ද නීති,

§ ප—සා, යන්නද-දු-සතං, යන්නද—ත-සබ්භියන්නද

රාජශබ්දයෙහි භූපිසය යනු "සතම-යොනමාගෙනා-බ්‍රහ්ම කත සඛරාජාදිතො අමානං-නාමිහි රඤ්ඤො, වා-රාජස්ස රාජු සුනංහිසු ච-රාජස්ස රඤ්ඤො, රාජිනො සෙ-රඤ්ඤං-නමිණි වා-ස්මිංහි රඤ්ඤෙ රාජිනි" යනමේ සූත්‍රයන්ගෙන්වූ වෙනසයි.

## බ්‍රහ්ම ශබ්දය

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප- | බ්‍රහ්මා, | බ්‍රහ්මානො |
| ආ- | බ්‍රහ්මෙ, | බ්‍රහ්මානො |
| දු- | බ්‍රහ්මානං, බ්‍රහ්මං, | බ්‍රහ්මානො, |
| ත-කා- | බ්‍රහ්මුනා, | බ්‍රහ්මෙහි, බ්‍රහ්මෙභි |
| ච- | බ්‍රහ්මුනො, බ්‍රහ්මස්ස, | බ්‍රහ්මානං, බ්‍රහ්මූනං |
| පං- | බ්‍රහ්මුනා, | බ්‍රහ්මෙහි, බ්‍රහ්මෙභි |
| ඡ- | බ්‍රහ්මුනො, බ්‍රහ්මස්ස, | බ්‍රහ්මානං. බ්‍රහ්මූනං |
| ස- | බ්‍රහ්මනි, | බ්‍රහ්මෙසු × |

මෙහි— දසය යනු, "බ්‍රහ්මතොගස්සච- උත්තංසනාසු-ඛිල නො ස ස්සානො වා-බ්‍රහ්මතොතු ස්මිංනි" යනමේ සූත්‍රයන්ගෙන්වූ ආදෙශයන්ගෙන් හා "උත්තං සනාසු" යන්න "උත්තං" යි බෙදීමෙන් උකාර බව වීමෙන්ද සිඩවූ පද පමනක් ගණින් ගෙණ බැව් සැලකියයුතුයි.

---

හැර—ච - සත්තං, යන්නට—සත්තානං; කියාද—පං—සණ්තා, සබ්බි, යනුහැරද—මහාශබ්දනීතියෙහි.

× තෘතීයා, කරණ, පචමී, බහුවචනත්‍රයෙහිම බ්‍රහ්මූහි, බ්‍රහ්මූභි, යි මහාශබ්දනීතියෙහි පෙණේ.

## සඛ ශබ්දය

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප- | සඛා, | සඛානො, සඛායො, සඛිනො |
| ආ- | සඛ, සඛා, සඛි, සඛී, සඛෙ, | සඛානො, සඛායො, සඛිනො, |
| දු- | සඛාරං, සඛානං, සඛං, | සඛානො, සඛායො, සඛිනො |
| ත-ක- | සඛිනා, | සඛාරෙහි, සඛාරෙභි, සඛෙහි, සඛෙභි |
| ච- | සඛිනො, සඛිස්ස, | සඛාරානං, සඛීනං |
| පං- | සඛාරා, සඛාරස්මා, සඛිනා | සඛාරෙහි, සඛාරෙභි සඛෙහි, සඛෙභි |
| ඡ- | සඛිනො, සඛිස්ස, | සඛාරානං, සඛීනං |
| ස- | සඛෙ, | සඛාරෙසු, සඛෙසු * |

මෙහි සවිස්තරය යනු "සඛාතො චායො නො-සඛාන්තස්සි ඉනොනානංසෙසු-සඛාතො ගස්සෙ වා-සුනංහිසු වා-ආරො හිම්හි වා-ස්මිමෙ" යනාදී සූත්‍රයන්ගෙන් සිද්ධ පද පමනක් සලකායි.

## සා ශබ්දය

| | | |
|---|---|---|
| ප- | සා [බල්ලා] | සා [බල්ලෝ] |
| ආ- | ස, | සා |
| දු- | සං, | සෙ |
| ත-ක- | සෙන, | සාහි, සාභි |
| ච- | සස්ස, සාය, | සානං |
| පං- | සා, සස්මා, සම්හා, | සාහි සාභි |
| ඡ- | සස්ස, | සානං |
| ස- | සෙ, සස්මිං, සම්හි, | සාසු § |

---

* ප, බ—සඛා-ච—ශ-බ-සඛානං; පං. එ සඛිම්හා-මිහා සඳහනිති.

§ ප, ආ, බ, සානො-දුසානං, සානෙ-ත, සානා, සානෙහි,

ඤාති ශබ්දයෙහි ප්‍රථමා ආලපන ද්විතීයා යන බහුවචනයන්
හෙහි "ඤාතිනො" යි සප්තමී එක වචනයෙහි "ඤාතිනි" යි
යන්කල එක්ජස පිරෙයි සෙසස අග්ගි ශබ්දයාමෙනි

ආදි ශබ්දයෙහි චතුෂ්කය යනු "ආදිතො මව" යන සූත්‍ර
යෙන් ස්මිං වචනයෙහි වෙනසුයි එනම් - ආදෙ, ආදිං, ආදි
මහි, ආදිස්මිං - යන සතර සලකායි සෙසස අග්ගි ශබ්දයෙහි
රූප මෙනි

දෙහී ශබ්දය

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප- | දෙහී [තිඋති] | දෙහී [තිඋනති] දෙහිනො |
| ආ- | දෙහී, | දෙහී, දෙහිනො |
| දු- | දෙහිනං, දෙහිං, | දෙහී, දෙහිනො |
| ත-ක- | දෙහිනා, | දෙහිහි, දෙහිභි |
| ච- | දෙහිනො, දෙහිස්ස, | දෙහිනං |
| පං- | දෙහිනා, දෙහිස්මා, දෙහිමහා, | දෙහිහි, දෙහිභි |
| ඡ- | දෙහිනො, දෙහිස්ස, | දෙහිනං |
| ස- | දෙහිනි, දෙහිස්මිං, දෙහිම්හි, | දෙහීසු |

ජන්තු ශබ්දයෙහි දෙහීසුන් යනු සප්තමී බහුවචනයෙහි
"ජන්තුසු" යන්න හැරයි සත්ථු ශබ්දයෙහි අටවිසනම
"සත්ථුපිතාදිනමාසිස්මිං සිලොප පාච - අයොසෑ ස්වාරතතං -
තතොගොනා මාතු - අකාර පිත ඤ්ඤාපනමා—ආකාරෙවා -
නාඅා - උස්සම්ංසලොපොව - වාතඑහි - සත්ථුනාතතව - තතො
ස්මිම් — ආරොර සසම්ක රෙ" යනමෙයින්වූ වෙනසයි *

---

සානෙහි - ච, සාසස, සානං - සානා, සානෙහි, සානෙහි - පං,
සානස, සානං - ඡ, සානෙ, සානෙසු ස. මහාසද්දනීති.

* පළමු එකවචනයට "සත්ථුනා" යන්නක් ඇතුලත්
කරගෙණ මෙගණිත සම්පූර්ණ කර තිබේ තෘතීයා එක
වචනයෙහිත් "සත්ථුනා" යන්නක් ටීකායෙහිපෙණේ.

පිතු ශබ්දයෙහිද "සත්ථුපිතාදීනමාසිස්මිං සිලොපොච" යන්නෙන් පිතු ශබ්දයාගේ අනන්ත ආකාර බවට පැමිණීමහා "පිතාදීනමසිම්හි" යන්නෙන් ආර්යකාදේශයාගේ හ්‍රස්වබව ද වෙනසයි ×

අභිභූ ශබ්දයෙහි-[සො] අභිභූ [තෙ] අභිභූ, අභිභුවො [හෙ] අභිභූ, [භවන්තො] අභිභූ, අභිභුවො, යනමේ පව්සය උපලක්ෂණ වශයෙන් ගන්නා ලද්දුහ සෙස්ස සිතබු ශබ්දයාමෙනි-විඤ්ඤූ ශබ්දයෙහි යො විභත්තීන් පරකල්හිවූ වෙනස පමනයි මෙසේදක්වනලද ශබ්දයන් කරණකොටගෙණ ඊටසමානවූ සියලු පුල්ලිඟු ප්‍රයොගයෝ සංග්‍රහ කටයුතු.

ඉත්ථිලිඞ්ගයෙහි වනාහි-කඤ්ඤා ශබ්දයෙහි; කඤ්ඤා, කඤ්ඤා, කඤ්ඤායො, යනාදී නයින් දෙවිසි ප්‍රයොගයෝ වෙති.

අම්මාශබ්දයෙහි "න අම්මාදිතො" යන සූත්‍රයෙන් ආලපනෙක වචනයට ඒකාර බව නොවීම හා "ආකාරොවා" යන්නෙන් හ්‍රස්ව බවද වෙනසයි එහෙයින්-අම්මා. අම්මා, අම්මායො[හෙ] අම්ම, අම්මා, (භොති,) අම්මා, අම්මායො-යනමේ සත ගන්නා ලද්දුහ සෙස්ස කඤ්ඤා ශබ්දයෙහි කියනලද රූප මෙනි රත්තිශබ්දයෙහි-රත්ති, රත්තී, රත්තියො-යනාදී නයින් සඞ්ඛ්‍යාකල කල්හි අට විස්ස පිරෙයි

පිශබ්දය, රත්තිශබ්දයා මෙනි-ද්‍රතියා එකවචනයෙහි-පිශං, පිං, යනුහා සප්තමී එකවචනයෙහි, පිසං, පියා, යනු පමනක් වෙනසයි.

පොක්ඛරණී ශබ්දයෙහි වනාහි යොවිභත්තීන් පරකල්හි වෙනසයි එ හෙයින්- පොක්ඛරණී. පොක්ඛරණී,- පොක්ඛරඤ්ඤො, පොක්ඛරණියො-යන සතර ගන්නා ලද්දුහ සෙස්ස කියනලද රූපමෙනි- නදී ශබ්දයෙහි-නදී, නදී නජ්ජො. නදියො-යනාදී වශයෙන් එක්තිසකි.

---

× මෙහිවූ කලී කාත්‍යායන රූපසිද්ධි ආදියෙහි නොදක්වන ලද චතුර්ථීෂෂ්ඨී බහුවචනයෙක්හි පිතුනං යී පදව යක් තිබේ.

## උරූ ශබ්දය

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප- | උරූ, | උරූ, උරුයො |
| ආ- | උරූ, | උරූ, උරුයො |
| දු- | උරුං, | උරූ, උරුයො |
| ත-ක- | උරුයා, | උරූහි, උරූභි |
| ච- | උරුයා, | උරූනං |
| පං- | උරුයා, | උරූහි, උරූභි |
| ඡ- | උරුයා, | උරූනං |
| ස- | උරුයං, උරුයා, | උරූසු |

මාතුශබ්දය පිතුශබ්දයාමෙනි; මෙහි ආරානාදෙශය හා හ්‍රස්වබවද වෙනසයි එහෙයින්—මාතා, මාතරො—යනාදි ප්‍රයොග සත්තිසක්වෙත්.

## භූ ශබ්දය

| | | |
|---|---|---|
| ප- | භූ, | භූ, භුවො |
| ආ | භූ, | භූ, භුවො |
| දු- | භුං, | භූ, භුවො |
| ත-ක- | භුවා, | භූහි, භූභි |
| ච- | භුවා, | භූනං |
| පං- | භුයා, | භූහි, භූභි |
| ඡ- | භුයා, | භූනං |
| ස- | භුයං, භුයා, | භූසු |

මෙසේ දක්වන ලද ශබ්දයන් කරණකොටගෙණ ඊට සමානවූ සියලු ස්ත්‍රීලිඞ්ගික ශබ්දප්‍රයොගයෝ සංග්‍රහ කට යුතු.

නපුංසක ලිඞ්ගයෙහි වනානි පද ශබ්දය චිත්තශබ්ද මෙනි - චිත්තශබ්දයෙහි මෙන් චතුර්ථී එකවචනයට ආය ශනාදෙශ නොවීම වෙනසයි.

## කම්ම ශබ්දය

| | එකවචන | බහුවචන |
|---|---|---|
| ප- | කම්මං, | කම්මා, කම්මානි |
| ආ- | කම්ම, | කම්මා, කූම්මානි, |
| දු- | කම්මං, | කම්මෙ, කම්මානි |
| ත-ක- | කම්මිනා, කම්මුනා, කම්මෙන, | කම්මෙහි, කම්මේභි |
| ච- | කම්මුනො, කම්මස්ස, | කම්මානං |
| පං- | කම්මුනා, කම්මා, කම්මම්හා, කම්මස්මා, | කම්මෙහි, කම්මෙභි |
| ඡ- | කම්මුනො, කම්මස්ස, | කම්මානං |
| ස- | කම්මෙ, කම්මනි, කම්මම්හි, කම්මස්මිං, | කම්මෙසු |

දධි ශබ්දය අට්ඨිශබ්දයාමෙනි—සප්තමී එකවචනයෙහි ස්මිංහට නි යනාදෙශයනොවීම පමණක් වෙනසයි

ආයු ශබ්දයෙහි සවිස්සය යනු සප්තමී බහුවචනයෙහි "ආයුසු" යන්න ගැරයි මෙසේ දක්වනලද ශබ්දයන් කරණ කොට ගෙණ ඊටසමානවූ සියලු නපුංසක ලිඞ්ගික ශබ්දප්‍රයොගයෝ සංග්‍රහ කටයුතුයි.

මෙසේ ලිඞ්ගත්‍රයෙහි කියනලද ශබ්ද ප්‍රයොගයෝ පුඩු කරණ ලද්දහු හසියහැටක් වෙත්.

නිමි


——*——

# ශුද්ධි පත්‍රය

—x—

| පිටේ | පෙලේ | අසුධ | ශුධ |
|---|---|---|---|
| 3 | 3 | ඉජ්ජි අගමා | ඉජ්ජීඅනමා |
| 4 | 6 | විජ්ජා මහාඉසා | විජ්ජු මහාමෙසො |
| 8 | 7 | ඌරු | උරු |
| ,, | ,, | ඌරු | උරු |
| ,, | 28 | | ජන්තුශබ්දයෙහි 32<br>සත්ත්වශබ්දයෙහි 28 |
| 9 | 3 | ඌරු | උරු |
| 12 | 1 | කාසවං | කාසාවං |
| 16 | 9 | ප්‍රගොග | ප්‍රයොග |
| 25 | 8 | ප්‍රත්‍යාදීන් | ප්‍රත්‍යයාදීන් |
| ,, | 24 | වෙන් | වෙත් |
| 26 | 11 | ප්‍රතයාදීහු | ප්‍රත්‍යයාදීහු |
| 30 | 3 | ගරුණා | ගරුනා |
| ,, | 9 | ගරුණා | ගරුනා |
| 32 | 19 | එතෙ | එතෙ |
| 35 | 23 | අකාරපිත | අකාරපිකා |

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු